ධර්මදානය පිණිස යි.

# අභිධර්මාවතරණය

## (සතර පරමාර්ථධර්ම)



සංස්කාරක

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

ප්‍රථම මුද්‍රණය

# අභිධර්මාවතරණය

## (සතර පරමාර්ථධර්ම)

සංස්කාරක

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

ප්‍රකාශනය

ශ්‍රී සද්ධර්ම සංසදය
'සදහම් සෙවණ'
134/A, ගලගෙදර වත්ත,
වැල්හේන පාර, මාතම්මන,
මිනුවන්ගොඩ.

විමසීම් : 071–4417813
විද්‍යුත් ලිපිනය : info@mahavihara.org
වෙබ් අඩවි : www.theravada.mahavihara.org
www.sadaham.net

ප්‍රථම මුද්‍රණය : වෙසක්/2556 ( 2012 මැයි )

Copyright © Sri Saddharma Sansadaya

## ශ්‍රී සද්ධර්ම සංසදයෙන් ප්‍රකාශිත වෙනත් ධර්මග්‍රන්ථ

**පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ**

- අසිරිමත් දනය
- සුපිරිසිදු නිවන් මඟ
- ධම්මචක්කප්පවත්තන සූත්‍රය
- ආනාපානසති භාවනාව
- ඉරියාපථ භාවනාව සහ සම්පජඤ්ඤ භාවනාව
- පටික්කූලමනසිකාර භාවනාව (පිළිකුල් භාවනාව)
- මහාසාරෝපම සූත්‍රය
- ධම්මානුස්සති භාවනාව
- කර්මය පිළිබඳ අගනා දෙසුමක් (චූළකම්මවිභඞ්ග සූත්‍රය)
- ක්‍රෝධය නසන මඟ (ආඝාතපටිවිනය සූත්‍රය)
- ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව
- උදකුක්ඛේපසීමාවිභාවිනී
- තිසරණ සහ පන්සිල්
- ඇත්පියවර උපමාව (චූළහත්ථිපදෝපම සූත්‍රය)
- දහම්ඇස පහළ වීම (ඤාණවත්ථුසූත්‍ර විවරණය)

**සමින්ද රණසිංහ**

- පින සහ කුසලය පිළිබඳ ථේරවාද විනිශ්චය

නැවත මුද්‍රණය සඳහා, සියලු විමසීම්,

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**'සදහම් සෙවණ'**
**134/A, ගලගෙදරවත්ත,**
**වැල්හේන පාර, මාතම්මන,**
**මිනුවන්ගොඩ.**

Tel :- **071 - 4417813**
Fax :- **071 - 8802012**
E-mail :- **info@mahavihara.org**
Web :- **www.theravada.mahavihara.org**
**www.sadaham.net**

# ධර්මදානය සඳහා දායකත්වය

* පින්වත් සනත් කොඩිතුවක්කු උපාසක මහතා සහ රසිකා මාලගේ මහත්මිය විසින් සත්මී දියණියන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක වීමට සහ නිදුක් නිරෝගීසුව පැතීම පිණිසත් මාතර, හිත්තැටිය (නැගෙනහිර) පදිංචි ව සිට අභාවප්‍රාප්ත වූ දයාපාල කොඩිතුවක්කු පියාණන්ට සහ ධර්මාවතී ලියනගේ මෑණියන්ටත් ගම්පහ කුමාරතුංග මාවතේ පදිංචි ව සිට අභාවප්‍රාප්ත වූ ප්‍රේමවංශ අල්විස් මහතාටත් පුණ්‍යානුමෝදනා කිරීම පිණිස මෙන් ම තමන්ට ද ධර්මාවබෝධය පිණිස,

* පින්වත් චන්දන ජයවර්ධන මහතා විසින් තමාට ධර්මාවබෝධය පිණිස ද පින්වත් සංජීව විජේසිංහ මහතා විසින් අභාවප්‍රාප්ත තම පියාණන්ට සහ ළදරුවියෙහි දී අභාවප්‍රාප්ත තුසිත විජේසිංහ සොහොයුරාට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස ද ඤාණවතී විජේසිංහ මහත්මිය විසින් අභාවප්‍රාප්ත තම ස්වාමිපුත්‍රයා වන ආරියතිස්ස කුඩාහෙට්ටි මහතාට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස,

* නුගේගොඩ, පින්වත් පණ්ඩුක මහානාම උපාසක මහතා සහ මහත්මිය විසින් අභාවප්‍රාප්ත රොෂාන් මහානාම පුතණුවන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස සහ තමන්ට නිදුක් නිරෝගි දීර්ඝායුෂ පැතීම පිණිස,

* පින්වත් ලලිතා රත්නසීලි උපාසිකා මාතාව විසින් ගම්පහ මාදෙල්ගමුවේ පදිංචි ව සිට අභාවප්‍රාප්ත N. A. D. කර්තේලිස් රාළහාමි පියාණන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් සුජීවත් ව සිටින සීලවතී ජයසේකර මෑණියන්ට සෙත් පැතීම පිණිස හා තමාට නිර්වාණාවබෝධය පිණිස,

* පින්වත් P. ගුණසේකර උපාසක මහතා සහ ලලිතා පද්මිණී මහත්මිය විසින් දෙමවුපියන්ට සහ ගුණපාල ගුණසේකර මහතාට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස හා දරුමුනුබුරන්ට සෙත් පැතීම පිණිස හා තමන්ට නිර්වාණාවබෝධය පිණිස,

* වළකුඹුර, පින්වත් W. A. ජයසිංහ උපාසක මහතා විසින් අභාවප්‍රාප්ත දෙමවුපියන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිස,

* නුගේගොඩ, පින්වත් රත්නායක මහත්මිය විසින් සියාරා, නෙහාරා හා සිහාල් යන මුනුබුරුමිනිබිරියන් ප්‍රඥාවන්ත හා පින්වත් දරුවන් වේවා'යි ප්‍රාර්ථනා කිරීම පිණිස,

* පින්වත් R. D. දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත දෙමවුපියන්ට සහ අභාවප්‍රාප්ත R. D. ලින්ටන් සොහොයුරාට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිස,

* පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා සහ උපේක්ෂා පියරංගිකා අල්විස් මහත්මිය විසින් කල්‍යාණමිත්‍රයන් වහන්සේලාට සහ දෙමවුපියන්ට සෙත් පැතීම පිණිස හා තමන්ට නිර්වාණාවබෝධය පිණිස,

* කොටුගොඩ, පින්වත් සරෝජා උදයංගනී මෙණෙවිය විසින් තමාට ධර්මාවබෝධය පිණිස,

*මෙම ධර්මදානය සිදු කරන ලදී.*

--*--

# පෙරවදන

සර්වඥදේශනය විනය, සූත්‍ර, අභිධර්ම වශයෙන් ත්‍රිවිධ ය. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, ඉතිවුත්තක, ධම්මපද, වේදල්ලාදි වශයෙන් නවවිධ ය. ධම්ම විනය වශයෙන් ද්විවිධ ය. මෙයින් ත්‍රිවිධනයෙහි ඇතුළත් 'අභිධර්ම' අභිධානයෙන් ද නවවිධ නයෙහි ඇතුළත් 'වෙය්‍යාකරණ' අභිධානයෙන් ද ද්විවිධ නයෙහි ඇතුළත් 'ධම්ම' අභිධානයෙන් ද අභිධර්මය ඇතුළත් බව ත්‍රිපිටකවේදීහු දනිත්.

මෙයින් විනයපිටකය ශීලයට පාදක ය. සූත්‍රපිටකය සමාධියට පාදක ය. අභිධර්මපිටකය විදර්ශනාවට පාදක ය. එබැවින් ශීල සමාධි ප්‍රඥ නම් වූ ත්‍රිශික්ෂාව සම්පාදනය වීමට මුළු ත්‍රිපිටකය ම හේතු වෙයි.

බුදුසසුනේ මුඛ්‍ය පරමාර්ථය නම් නිර්වාණය සාක්ෂාත් කිරීම ය. ඒ සඳහා විදර්ශනාව වැඩිය යුතු ම ය. විදසුන් වැඩීමට නම් චක්ඛු, සෝත, ඝානාදි ආයතන දොළස ය, ධාතු අටළොස ය, ඉන්ද්‍රිය දෙවිස්ස ය, ස්කන්ධ පස ය යනාදි ගැඹුරු දහම් ගැන ශ්‍රුතමයඥානය අත්‍යවශ්‍ය ය. එම දැනුම ලැබීමට නම් අභිධර්ම පිටකය හැදෑරිය යුතු ම ය.

මෙකල සාමාන්‍ය ජනයාට තබා පැවිද්දන්ට ද අභිධර්මය හැදෑරීමේ මංපෙත් විරල ය. ඒ එහි ඇති ගැඹුරු බව නිසා ම ය. එනිසා ම වන්නට දෝ නිවන සාමාන්‍ය ජනයා වෙතින් ඈත් වුණු බවක් පෙනේ. අභිධර්මය සරල ව දෙසිය හැකි නො වතුදු හැකිතාක් ලිහිල් බසකින් ලියැවුණු පොතක් වේ නම් එය සාමාන්‍ය ජනතාවට පමණක් නොව සියල්ලන්ට ම මහෝපකාරී වනු ඇතැ'යි කලෙක පටන් අප සිතෙහි ද පැවති අදහසකි. එනමුදු මේ කර්තව්‍යය කිරීමට සමර්ථයන් අද සුලභ නැත.

එබඳු වාතාවරණයක් තුළ පූජ්‍ය නාවල ධම්මානන්ද

ස්ථවිරයෝ මේ සම්බන්ධ ව අවධානය යොමු කොට සම්පාදනය කළ අභිධර්මාවතරණ පුස්තකය මෙම අවශ්‍යතාව සපුරාලන්නකි.

මෙය කියවීමෙන් විශාල ධර්ම ප්‍රීතියක් අත්විඳීමි. හුදීජනයාගේ හිතසුව පිණිස අද මෙම ධර්මපුස්තකය එළිදැක්වීම බෞද්ධජනයාගේ භාග්‍යයකි. එය ඔබ සැමට නිවන් මඟ යාමට මහෝපකාරයකි.

එහෙයින් ඔබ අප සැම පූජනීය නාවල ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේට කෘතඥ විය යුතු ය.

'ධම්මෝ දිප්පතු'!

මෙයට,

පූජ්‍ය නුවරඑළියේ ඤාණසීල ස්ථවිර,
රණගිරිය අරණ්‍යසේනාසනය,
දේවගිරිය,
දිද්දෙණිය,
මැල්සිරිපුර.
(වෙසක් 2556)

# හැඳින්වීම

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ බුද්ධවචනය අතර උත්කෘෂ්ට වූ පරමාර්ථ ධර්මදේශනාව වන්නේ අභිධර්මපිටකය යි. දැනට ත්‍රිපිටකධර්මයෙහි සඞ්ගෘහිත ව තිබෙන අභිධර්මපිටකය වනාහි ධර්මසේනාපති සාරිපුත්ත මහරහතන් වහන්සේගේ ධර්මසඞ්ග්‍රහය යි (**"අභිධම්මෙ වාචනාමග්ගො නාම සාරිපුත්තත්ථෙරප්පභවො"**). භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සත්වන වස්-කාලයෙහි තාවතිංසභවනයෙහි වස් වසා මාතෘදිව්‍යරාජයා ප්‍රධාන දිව්‍ය බ්‍රහ්මයන්ට අභිධර්මය දේශනා කරන අතර පිඬු පිණිස දිනපතා මනුලොවට වැඩම කළ අවස්ථාවෙහි දී උපස්ථානයට පැමිණෙන සාරිපුත්ත මහරහතන් වහන්සේට දෙව්ලොව දී විස්තර කෙරෙන අභිධර්මදේශනාවෙහි මාතෘකා (නය) සැකෙවින් දේශනා කළ සේක. ධර්මසේනාපති සාරිපුත්ත මහරහතන් වහන්සේ විසින් එසේ බුදුරජාණන් වහන්සේ වෙතින් උගත් මාතෘකා තම ප්‍රඥාවේ පමණින් මධ්‍යම ප්‍රමාණයෙන් විස්තර කොට තමන් වහන්සේගේ අතවැසි පන්සියයක් භික්ෂූන් වහන්සේලාට උගන්වා වදාළ සේකැ'යි 'අත්ථසාලිනී' නම් වූ ධම්මසඞ්ගණිප්පකරණ අට්ඨකථාවෙහි සඳහන් වේ. මෙසේ එක ම වස් කාලය තුළ තුන් අයුරකින් අභිධර්මය දේශනා කළ බව ථේරවාදය යි. දැනට අපට දක්නට ලැබෙන අභිධර්මපිටකයට අයත් සප්තප්‍රකරණ වනාහි බුදුරජාණන් වහන්සේ සත්වන වස්-කාලයෙහි දෙවියන්ට දේශනා කරනු ලැබූ අභිධර්මදේශනාව නොව එම දේශනාවේ සඞ්ක්ෂිප්ත මාතෘකා ධර්මසේනාපති සාරිපුත්ත මහරහතන් වහන්සේට වදාළ කල්හි සාරිපුත්ත මහරහතන් වහන්සේ විසින්

තම අතවැසි පන්සියයක් භික්ෂූන් වහන්සේලාට උගන්වාලූ ස්වරූපය යි. එම සප්තප්‍රකරණ නම්,

1. ධම්මසඞ්ගණිප්පකරණ
2. විභඞ්ගප්පකරණ
3. ධාතුකථාප්පකරණ
4. පුග්ගලපඤ්ඤත්තිප්පකරණ
5. කථාවත්ථුප්පකරණ
6. යමකප්පකරණ
7. පට්ඨානප්පකරණ

යනු යි. ඒ අතරින් කථාවත්ථුප්පකරණය සම්පූර්ණත්වයට පත් කරන ලද්දේ තුන්වන ධර්මසඞ්ගායනාවෙහි දී මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසිනි. මෙසේ සඞ්ගෘහිත වූ අභිධර්මපිටකය ආධුනිකයන්ට හැදෑරීමේ පහසුව සඳහා පසුකාලීන ධර්මධර තෙරවරුන් විසින් ග්‍රන්ථ රැසක් සම්පාදනය කරන ලදී. ඒ අතරින් පොළොන්නරු යුගයෙහි දී සඞ්ගෘහිත වූ 'අභිධම්මත්ථසඞ්ගහ' ග්‍රන්ථය අභිධර්ම ප්‍රවේශ ග්‍රන්ථ අතරින් මූලික තැනක් ගනී. එම ග්‍රන්ථයට පරිවාර වශයෙන් ලියැවුණු ග්‍රන්ථ මහත් රැසකි. ඒ අතරින් අතිපූජ්‍ය රේරුකානේ චන්‍දවිමල මහානාහිමිපාණන් වහන්සේ විසින් සම්පාදිත 'අභිධර්ම මාර්ගය' ග්‍රන්ථය ආධුනිකයන්ට මහත් වූ අත්වැලක් සපයන ග්‍රන්ථයකි. **'අභිධර්මාවතරණය'** නමින් අප විසින් සඞ්ගෘහිත වූ මෙම සඞ්ක්ෂිප්ත අභිධර්ම සඞ්ග්‍රහය සකස් කිරීම සඳහා ද අතිපූජ්‍ය රේරුකානේ චන්‍දවිමල මහානාහිමිපාණන් වහන්සේගේ 'අභිධර්ම මාර්ගය' ග්‍රන්ථය බෙහෙවින් උපකාරී වූ බව සඳහන් කරනුයේ කෘතඥතා පෙරදැරිව ය. එම ග්‍රන්ථයෙන් අවශ්‍ය කරුණු උපුටා ගැනීමට

ලිඛිත අවසරය ලබා දුන් ශ්‍රී චන්‍දවිමල ධර්මපුස්තක සංරක්‍ෂණ මණ්ඩලයේ ගරු ලේකම් සී. තනිප්පුලිආරච්චි මහතාට ද මාගේ විශේෂ ස්තුතිය පිරිනමමි.

මෙබඳු ග්‍රන්ථයක් එළිදැක්වීම සඳහා මා දිරිමත් කරන ලද්දේ විගඩ බෙම්මුල්ලේ පින්වත් කපිල පීරිස් මහතා විසිනි. විගඩ, බෙම්මුල්ලේ ශ්‍රී ධම්මයුක්තිකාරාම පුරාණ විහාරස්ථානයේ දහම්පාසලේ අභිධර්ම ගුරුවරයෙකු වන එම මහතා දහම්පාසලේ දරුදැරියනට අභිධර්මය උගැන්වීමට අවශ්‍ය කුඩා සඞ්ග්‍රහ-ග්‍රන්ථයක අවශ්‍යතාව වටහා ගෙන ඒ සඳහා අවශ්‍ය සටහන් ද පිළියෙළ කර ගෙන එම සටහන් ග්‍රන්ථයක් වශයෙන් සකස් කිරීමේ අවශ්‍යතාව අප වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ක්‍රියාත්මක වූ අප විසින් එම සටහන් ද සැලකිල්ලට ගෙන මෙම ග්‍රන්ථය පිළියෙළ කරන ලද්දේ දහම්පාසල් සිසුන්ට, දහම්පාසල් ගුරුභවතුන්ට මෙන් ම අභිධර්මය ඉගෙනගනු කැමති ආධුනිකයන්ට ද අත්වැලක් වනු පිණිස ය. 2600 වන සම්බුද්ධත්‍වජයන්තිය සපිරෙන මෙම වෙසක් පුණ්‍යපොහොය නිමිත්තෙන් මෙම ධර්මසඞ්ග්‍රහය එළිදක්වන්නට ලැබීම සතුටට කරුණකි. මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමෙන් අප විසින් අත්පත් කර ගන්නා ලද කුසලසම්භාරය බුද්ධශාසනයේ චිරස්ථිතිය සඳහා ම හේතු වේවා’යි ප්‍රාර්ථනා කරමි.

එසේ ම මෙම ධර්මසඞ්ග්‍රහය සම්පාදනය කිරීමෙන් අප විසින් ජනිත කර ගත් ධර්මදානමය කුසල සම්භාරය අපගේ ප්‍රව්‍රජ්‍යාචාර්ය අතිගරු පූජනීය කිතුලම්පිටියේ ආනන්‍ද ස්වාමීන් වහන්සේට ද සෙසු ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලාට ද අත්පත් වීමෙන් ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන්සුව සැලසේවා!

විවිධාකාරයෙන් මාහට උපකාර කරන දිද්දෙණිය, රණගිරිය අරණ්‍ය-සේනාසනාධිවාසි පූජනීය නුවරඑළියේ ඤාණසීල

ස්වාමීන් වහන්සේ ප්‍රධාන සෙසු ස්වාමීන් වහන්සේලාට ද කඳුරුවැව ධර්මරාජගල අරණ්‍යසෙනසුනේ අපගේ සබ්‍රහ්මචාරීන් වහන්සේලාට ද මෙම ධර්මදානමය කුසල බලයෙන් ආයුරාරෝග්‍ය-සම්පත් හා නිවන්සුව අත්පත් වේවා!

හැදූවැඩූ මවුපිය දෙදෙනා වහන්සේටත් සිවුපසයෙන් උපස්ථාන කරන දායකකාරකාදි සැමටත් විශේෂයෙන් ම මෙම ධර්මග්‍රන්ථය මුද්‍රණය කිරීම සඳහා ශ්‍රී සද්ධර්ම සංසදය වෙනුවෙන් තම වටිනා කාලය, ශ්‍රමය, ධනය වැය කරමින් දිවා-රාත්‍රී වෙහෙස වූ පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත අල්විස්, උපේක්ෂා පියරංගිකා අල්විස් මහත්මමහත්මීන්ටත් අපගේ ධර්මදානමය පුණ්‍යකර්ම සඳහාත් අප විනයාලඞ්කාර ශ්‍රාවකසභාවේ කටයුතු සඳහාත් පුරෝගාමී ව අනුග්‍රහ කරන පින්වත් සනත් කොඩිතුවක්කු මහතා ප්‍රධාන පින්වතුන්ටත් මේ සඳහා සහාය වූ සෙසු සැමදෙනාටත් මෙම ධර්මදානමය කුසලකර්මයේ බලයෙන් ධර්මඥාන, භාවනාඥාන වර්ධනය කර ගෙන සුව සේ නිවන්සුව අත්විඳීමට ලැබේවා!

මෙම ධර්මදානමය කුසල කර්මය ඉන්ද්‍රෝපේන්ද්‍රාදි දිව්‍යරාජ බ්‍රහ්මරාජ සමූහයාටත් සදේවකලෝකයාටත් නිර්වාණාවබෝධය පිණිස ම හේතු වේවා!

සාධු! සාධු!! සාධු!!!

මෙයට,

සසුන් ලැදි,

පූජ්‍ය නාවල ධම්මානන්ද හිමි.

අනුශාසක,

මහාවිහාරීය ශ්‍රී විනයාලඞ්කාර ශ්‍රාවක සභාව

ධර්මරාජගල අරණ්‍යසේනාසනය,

කඳුරුවැව, ඇහැටුවැව.

(වෙසක්/2600 සම්බුද්ධත්වජයන්තිය )

# පටුන

සතර පරමාර්ථධර්ම ———— 01

**1. චිත්ත-පරමාර්ථය** ———— 04

* කාමාවචර සිත් 54 ———— 06

* අකුසල් සිත් 12 ———— 07

* අහේතුක සිත් 18 ———— 10

* කාමාවචර-සෝභන සිත් 24 ———— 12

* රූපාවචර කුසල - විපාක - ක්‍රියා සිත් 15 ———— 15

* අරූපාවචර කුසල - විපාක - ක්‍රියා සිත් 12 ———— 16

* ලෝකෝත්තර සිත් 8 ———— 17

**2. චෛතසික-පරමාර්ථය** ———— 20

* අන්‍යසමාන රාශිය ———— 21

* අකුසල රාශිය ———— 23

* සෝභන රාශිය ———— 25

* චෛතසික සම්ප්‍රයෝගය ———— 30

* චිත්තවීථි ———— 31

* භවාඞ්ග සිත් ———— 33

* මරණාසන්න ජවන වීථිය ———— 35

**3. රූප-පරමාර්ථය** ———— 39

**4. නිබ්බාන (නිර්වාණ) - පරමාර්ථය** ———— 47

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!
(භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!)

# සතර පරමාර්ථධර්ම

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ පරිදි සංසාර පැවැත්ම වනාහි කාමභව-රූපභව-අරූපභව යනුවෙන් භව තුනක සඞ්ග්‍රහයකි. දළ වශයෙන් ඒ මෙසේ ය.

## 1. <u>කාමභවය / කාමභූමිය</u>

**සතර අපාය (දුගති)**

1. නිරය - මහානිරය අටකි. එක් එක් මහානිරයකට සම්බන්ධ ඔසුපත් නිරය 16 බැගින් ඇත. ඒ අනුව සියල්ල 128 + 8 = 136 වේ.
   - **i.** සංජීව **ii.** කාලසූත්‍ර **iii.** සඞ්ඝාත
   - **iv.** රෞරව **v.** මහාරෞරව **vi.** තාප
   - **vii.** ප්‍රතාප **viii.** අවීචි
2. තිරිසන්ලෝකය
3. ප්‍රේතලෝකය
   - **i.** උතුපජීවී **ii.** ඛුප්පිපාසික
   - **iii.** නිජ්ඣාමතණ්හික **iv.** පරදත්තූපජීවී
4. අසුරනිකාය

**කාම සුගති භූමි**

5. මනුෂ්‍යලෝකය
6. චාතුම්මහාරාජික දෙව්ලොව
7. තාවතිංස දෙව්ලොව
8. යාම දෙව්ලොව
9. තුසිත දෙව්ලොව
10. නිම්මානරති දෙව්ලොව
11. පරනිම්මිතවසවත්ති දෙව්ලොව

(6 - 11: **සදෙව්ලෝ**)

## 2. <u>රූපභවය / රූපභූමිය</u>

1. බ්‍රහ්මපාරිසජ්ජ
2. බ්‍රහ්මපුරෝහිත
3. මහාබ්‍රහ්ම
4. පරිත්තාභ
5. අප්පමාණාභ
6. ආභස්සර
7. පරිත්තසුභ
8. අප්පමාණසුභ
9. සුභකිණ්හ
10. වෙහෙප්ඵල
11. අසඤ්ඤසත්ත
12. අවිහ
13. අතප්ප
14. සුදස්ස
15. සුදස්සී
16. අකනිට්ඨ

(12–16: සුද්ධාවාස)

## 3. <u>අරූපභවය / අරූපභූමිය</u>

1. ආකාසානඤ්චායතන
2. විඤ්ඤාණඤ්චායතන
3. ආකිඤ්චඤ්ඤායතන
4. නේවසඤ්ඤානාසඤ්ඤායතන

මෙම භවත්‍රයට අයත් සියලු සචිත්තක දේ මෙන් ම අචිත්තක දේ පරමාර්ථධර්ම තුනකට සඞ්ග්‍රහ කළ හැකි වේ. <u>'පරමාර්ථ' නම්, ලොව සැබෑ ලෙස, සත්‍ය ලෙස පවතින දේ ය.</u> අප විසින් සත්ත්වයන්, පුද්ගලයන් හා ද්‍රව්‍ය ලෙස සලකනු ලබන දේ බොහෝසෙයින් සම්මුති හෙවත් ප්‍රඥප්තිධර්මයෝ ය.

කලක දී ළදරුවා තවත් කලක් යන විට තරුණයෙකි. තරුණයා තවත් කලක දී මහල්ලෙකි. මහල්ලා මිය ගිය පසු මළසිරුර ඉතිරි වේ. මළසිරුර දිරා යන විට ඇටසැකිල්ල දැකිය හැකි වේ. ඇටසැකිල්ල කලක දී පස් ගොඩක් වේ. ඒ අනුව ළදරුවා, තරුණයා, මහල්ලා, මළසිරුර, ඇටසැකිල්ල, පස් යන මේ සියල්ල නියම වශයෙන් ලොව පවතින දේ නොව කලින් කලට වෙනස් වෙමින් යන ප්‍රඥප්ති හෙවත් සම්මුති රැසක් පමණි. ඒ අනුව භවත්‍රයෙහි පවතින සෑම දෙයක් ම අවසානය දක්වා ම සියුම් ලෙස නුවණින් බෙද බැලීමෙහි දී සැබෑ ලෙස, සත්‍ය ලෙස පවතින දේ අභිධර්මයෙහි හැඳින්වෙන්නේ 'පරමාර්ථ' නමිනි. ලෝකයට අයත් අප්‍රාණික-සප්‍රාණික සෑම දෙයක ම මූලය වන්නේ පරමාර්ථධර්ම ය. ඒ කිසිවක් ද්‍රව්‍ය නො වන අතර හුදෙක් හේතු-ඵල ක්‍රියාවලියක් පමණි. පරමාර්ථධර්මයන්ගේ හැඩයක්, සටහනක් දැක්විය නො හැක. පරමාර්ථධර්ම සඞ්ඛත හා අසඞ්ඛත වශයෙන් දෙවැදෑරුම් වන අතර 'සඞ්ඛත' යනු හේතු-ඵල වශයෙන් සැකසුණු දේ ය. 'අසඞ්ඛත' යනු හේතු-ඵල වශයෙන් සැකසීමක් නැති නිර්වාණධාතුව යි. පරමාර්ථධර්ම සියල්ල සතරකි. ඒ මෙසේ යි.

**1.** චිත්ත
**2.** චෛතසික } සඞ්ඛත
**3.** රූප
**4.** නිර්වාණධාතුව ⟶ අසඞ්ඛත

# 1. චිත්ත-පරමාර්ථය

චිත්තය යනු අරමුණු දැනීම යි. විඤ්ඤාණය - මනස - සිත යනාදි නම් යෙදෙන්නේත් ඒ සඳහා ම ය. අරමුණු දැනීම හෙවත් සිත ස්වභාවයෙන් එකක් වුව ද අභිධර්මය අනුව එය මූලික වශයෙන් සිත්-89 හා විස්තර වශයෙන් සිත්-121 ලෙසින් බෙදා දක්වේ. සිත් ප්‍රභේද වන්නේ භූමි, ජාති, යනාදි වශයෙනි. මෙලෙස අරමුණු දැනීම් වශයෙන් සිත එකක් වුව ද කාමාවචර, රූපාවචර, අරූපාවචර සහ ලෝකෝත්තර වශයෙන් භූමි සතරකට බෙදනු ලැබේ.

I. **කාමාවචර සිත්** - ඉහත සඳහන් එකොළොස්වැදෑරුම් කාමභූමියෙහි බහුල වශයෙන් පහළ වන සිත් 'කාමාවචර' ය.

II. **රූපාවචර සිත්** - ඉහත සඳහන් සෙළොස්වැදෑරුම් රූපභූමියට අයත් අසඤ්ඤතලය හැර සෙසු පසළොස්වැදෑරුම් රූපභූමියෙහි බහුල වශයෙන් පහළ වන සිත් 'රූපාවචර' ය. අසඤ්ඤතලයෙහි පටිසන්ධි-විඤ්ඤාණයක් හෝ අන්‍ය වූ සිතක් හෝ එහි සිටින කාලය තුළ පහළ වන්නේ නැත. පූර්ව කර්මබලයෙන් අසඤ්ඤතලයෙහි පහළ වන විට කර්මජරූප හටගන්නා අතර ආයු කෙළවර පූර්ව කර්මබලයෙන් වෙනත් තැනක උපදී. (එවිට නැවත සිත් පහළ වේ.)

III. **අරූපාවචර සිත්** - ඉහත සඳහන් සිවුවැදෑරුම් අරූපභූමියෙහි බහුල වශයෙන් පහළ වන සිත් 'අරූපාවචර' ය.

IV.**ලෝකෝත්තර සිත්** - ලෝකෝත්තරභූමිය වශයෙන් විශේෂ ස්ථානයක් නැත. ලෝකෝත්තරධර්ම ම ලෝකෝත්තරභූමිය යි. කාම-රූප-අරූප යන භූමිත්‍රයෙහි වෙසෙන මාර්ගඵලලාභීන් තුළ මෙම සිත් පහළ වේ.

* **විශේෂ කරුණු** - කාම-රූප-අරූප යන භූමි තුනෙහි වෙසෙන සත්ත්වයන් තුළ ඒ භූමියට සීමා නො වූ වෙනත් භූමින්ට අදාළ සිත් ද පහළ විය හැකිය. එසේ වුව ද ඒ සිතට බහුල වශයෙන් පහළ වන භූමියෙහි නම ම කියනු ලැබේ. උදහරණයක් ලෙස කාමභූමියට අයත් මනුෂ්‍යයෙකු ප්‍රථමධ්‍යානය ඇති කර ගත්තේ නම්, එවිට ඇති වන ප්‍රථමධ්‍යාන සිත 'රූපාවචර' සිතකි. ඔහු 'ආකාසානඤ්චායතන' නම් වූ ප්‍රථම අරූපසමාපත්තිය ඇති කර ගත්තේ නම්, එය 'අරූපාවචර' සිතකි. ඔහු 'සෝතාපත්ති' මාර්ගයට හා ඵලයට පත් වූයේ නම්, එම සිත් 'ලෝකෝත්තර' සිත් ය.

එසේ ම මෙම සිත් කම්ම (කර්ම) - විපාක (කර්මඵලය) - කිරිය (ක්‍රියා) වශයෙන් ද ප්‍රභේද වේ.

**1)** යමෙකුගේ සන්තානයෙහි ඇති වුවහොත් අනාගයෙහි ඊට අනුරූප විපාකයක් ඇති කිරීමට සමත් වන කුසල් සහ අකුසල් සිත්, කර්ම ගණයට අයත් වේ.

**2)** කුසල් හෝ අකුසල් සිදු කළ තැනැත්තාගේ සන්තානයට අයත් ව ඒ කුසල් හෝ අකුසල් නිසා එහි ඵලයක් වශයෙන් අනාගතයෙහි ඇති වන සිත්, විපාක ගණයට අයත් වේ.


**3)** අනාගතයෙහි විපාක උපදවන්නේ ද නැති, යම්කිසි කුසල

හෝ අකුසලයක විපාකයක් ද නො වන සිත් 'ක්‍රියා සිත්' නම් වේ.

මෙම විපාක හා ක්‍රියා සිත්, අව්‍යාකෘත සිත් නමින් ද හැඳින්වේ.

තව ද මෙම සිත් සියල්ල අහේතුක සහ සහේතුක වශයෙන් ද ප්‍රභේද වේ. අභිධර්මයෙහි 'හේතු' නාමය යෙදෙන්නේ ලෝභ, දෝස, මෝහ යන අකුසල-මූල තුනට සහ අලෝභ, අදෝස, අමෝහ යන කුසල-මූල තුනට ය. මෙම හේතු එකක් හෝ නො යෙදෙන සිත් 'අහේතුක සිත්' නම් වේ. එබඳු සිත් අටළොසකි (18). හේතු (කුසල-මූල/අකුසල-මූල) එකක් හෝ යෙදෙන සිත් 'සහේතුක' ය. ඒ අනුව අහේතුක සිත් දහඅට හැර සෙසු සිත් සියල්ල සහේතුක ය.

## 1.I කාමාවචර සිත් 54



## 1.I (අ) අසෝභන සිත් 30

අසෝභන සිත් වනාහි අකුසල් සිත් 12 සහ අහේතුක සිත් 18 වශයෙන් කොටස් 2 කි.

## 1.I (ඉ) අකුසල් සිත් 12

### (ඉ.1) ලෝභමූල සිත් 8

1. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික සිත
2. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසඞ්ඛාරික සිත
3. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසඞ්ඛාරික සිත
4. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසඞ්ඛාරික සිත
5. උපේක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික සිත
6. උපේක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසඞ්ඛාරික සිත
7. උපේක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසඞ්ඛාරික සිත
8. උපේක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසඞ්ඛාරික සිත

* **විශේෂ කරුණු**

1. මෙහි ලා 'සෝමනස්ස සහගත සිත්' යනු සෝමනස්ස වේදනාවෙන් යුක්ත සිත් ය. (අරමුණෙහි මිහිර විඳින්නා වූ ස්වභාවය සෝමනස්සය යි.)
2. මෙම සිත් අතර 'උපේක්ඛා සහගත' සිත් යනු උපේක්ෂා වේදනාවෙන් යුක්ත සිත් ය. (අරමුණෙහි මධ්‍යස්ථ වූ විඳීම උපේක්ෂාව යි.)
3. 'දිට්ඨිගත සම්ප්‍රයුක්ත' යනු 'කුසල්-අකුසල් ආදිය නැත. එහි විපාකයක් නැත' යනාදි වශයෙන් ගත් මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත බව යි. එබඳු මිථ්‍යාදෘෂ්ටියක් නො යෙදුණු සිත 'දිට්ඨිගත විප්පයුත්ත' ය.

4. අනුන්ගේ මෙහෙයවීමක් හෝ තමා විසින් ම නැවත නැවත උනන්දු කරවීමක් හෝ නැති ව පහළ වන සිත් 'අසඞ්ඛාරික' ය. අනුන්ගේ මෙහෙයවීමකින් හෝ තමා විසින් ම නැවත නැවත උනන්දු කරවීමෙන් හෝ පහළ වන සිත් 'සසඞ්ඛාරික' ය.
5. ලෝභ - දෝස - මෝහ - අලෝභ - අදෝස - අමෝහ යන හේතු හය අතරින් මෙම සිත්වල යෙදෙන්නේ ලෝභ-මෝහ යන හේතු දෙක ය. එබැවින් මෙම සිත් 'සහේතුක' වන අතර අනාගතයෙහි විපාක උපදවන බැවින් 'කර්ම' සිත් වේ.
6. අදත්තාදන (සොරකම), කාමමිච්ඡාචාර (කාමයන්හි වරදවා හැසිරීම), මුසාවාද (බොරු කීම), පිසුණාවාචා (කේලාම් කීම), සම්පප්ඵලාප (හිස්වචන කීම), අභිජ්ඣා (විෂම ලෝභය), මිච්ඡාදිට්ඨි (වැරදි දෘෂ්ටිය) යන අකුසල කර්මපථ සත සිදුවන්නේ මෙම ලෝභමූල සිත් මුල් වීමෙනි.

**(ඉ.2) දෝසමූල (පටිඝ) සිත් 2**

1. දෝමනස්ස සහගත පටිඝසම්පයුත්ත අසඞ්ඛාරික සිත
2. දෝමනස්ස සහගත පටිඝසම්පයුත්ත සසඞ්ඛාරික සිත

*** විශේෂ කරුණු**

1. මෙහි ලා 'දෝමනස්ස සහගත සිත්' යනු 'දෝමනස්ස' වේදනාවෙන් යුක්ත සිත් ය. (අරමුණෙහි අමිහිරි බව විඳින්නා වූ ස්වභාවය දෝමනස්සය යි.)
2. අනුන්ගේ මෙහෙයවීමක් හෝ තමා විසින් ම නැවත

නැවත උනන්දුකරවීමක් හෝ නැති ව පහළ වන සිත් 'අසඞ්ඛාරික' ය. අනුන්ගේ මෙහෙයවීමෙන් හෝ තමා විසින් ම නැවත නැවත උනන්දු කරවීමෙන් හෝ පහළ වන සිත් 'සසඞ්ඛාරික' ය.

3. ලෝභාදි හේතු හය අතරින් මෙම සිත්වල යෙදෙන්නේ දෝස - මෝහ යන හේතු දෙක යි. එබැවින් මෙම සිත් සහේතුක වන අතර අනාගතයෙහි විපාක උපදවන බැවින් 'කර්ම' සිත් වේ.

4. පානාතිපාත (සතුන් මැරීම), අදත්තාදන (සොරකම), මුසාවාද (බොරු කීම), පිසුණාවාචා (කේලාම් කීම), ඵරුසාවාචා (පරුෂවචන කීම), සම්පප්ඵලාප (හිස්වචන කීම), ව්‍යාපාද (වෛරය) යන අකුසල කර්මපථ සත සිදු වන්නේ මෙම දෝසමූල සිත් මුල් වීමෙනි.

**(ඉ.3) මෝහමූල සිත් 2**

1. උපේක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත
2. උපේක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිත

*** විශේෂ කරුණු**

1. මෝහමූල සිත් උපේක්ෂා වේදනාවෙන් යුක්ත ය.
2. මෝහමූල සිත් අනුන්ගේ මෙහෙයවීමක් නැති ව ස්වභාවයෙන් ම සත්ත්වයන් තුළ ඇති වන සිත් කොටසක් වශයෙන් සලකන බැවින් 'අසඞ්ඛාරික' ගණයට අයත් වේ.
3. ලෝභාදි හේතු හය අතරින් මෙම සිත්වල යෙදෙන්නේ මෝහය පමණි. එබැවින් මෙම සිත් සහේතුක වන අතර අනාගතයෙහි විපාක උපදවන බැවින් කර්ම සිත් වේ.

4. අකුසල් සිත්වල යෙදෙන හේතු අතරින් ලෝභය (ඇලීම) හා දෝසය (ගැටීම) එක ම සිතක යෙදෙන්නේ නැත. එනිසා අකුසල් සිත්වල උපරිම වශයෙන් යෙදෙන්නේ හේතු දෙකකි. එබැවින් ත්‍රිහේතුක අකුසල් සිත් හෝ ත්‍රිහේතුක අකුසල විපාක සිත් හෝ නැත. එසේ ම මෝහය පමණක් යෙදෙමින් එක හේතුවක් පමණක් ඇති සිත් විද්‍යමාන වන්නේ ද අකුසල් සිත් (කර්ම) කොටසෙහි පමණි.

## 1.I (ඊ) අහේතුක සිත් 18

ලෝභ - දෝස - මෝහ - අලෝභ - අදෝස - අමෝහ යන හේතු එකක් හෝ නො යෙදෙන සිත් 'අහේතුක' සිත් ය. ඒවා අකුසල විපාක, අහේතුක කුසල විපාක සහ අහේතුක ක්‍රියා වශයෙන් කොටස් තුනකි.

### (ඊ.1) අකුසල විපාක සිත් සත

1. උපේක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණය
2. උපේක්ඛා සහගත සෝතවිඤ්ඤාණය
3. උපේක්ඛා සහගත ඝානවිඤ්ඤාණය
4. උපේක්ඛා සහගත ජිව්හාවිඤ්ඤාණය
5. උපේක්ඛා සහගත කායවිඤ්ඤාණය
6. උපේක්ඛා සහගත සම්පටිච්ඡන සිත
7. උපේක්ඛා සහගත සන්තීරණ සිත

(ඊ.2) අහේතුක කුසල විපාක සිත් අට

1. උපේක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණය
2. උපේක්ඛා සහගත සෝතවිඤ්ඤාණය
3. උපේක්ඛා සහගත ඝානවිඤ්ඤාණය
4. උපේක්ඛා සහගත ජිව්හාවිඤ්ඤාණය
5. උපේක්ඛා සහගත කායවිඤ්ඤාණය
6. උපේක්ඛා සහගත සම්පටිච්ඡන සිත
7. සෝමනස්ස සහගත සන්තීරණ සිත
8. උපේක්ඛා සහගත සන්තීරණ සිත

* **විශේෂ කරුණු**

1. ඇස, කන, නාසය, දිව, ශරීරය, හෘදයරූපය වශයෙන් සිත් උපදින තැන් සයකි. ඒ අතරින් ඇස, කන, නාසය, දිව, ශරීරය යන පඤ්චේන්ද්‍රියයන්ගේ ප්‍රසාදයන්හි පහළ වන්නේ අකුසල විපාක සහ අහේතුක කුසල විපාක වශයෙන් උපදින චක්ඛුවිඤ්ඤාණ - සෝතවිඤ්ඤාණ - ඝානවිඤ්ඤාණ - ජිව්හාවිඤ්ඤාණ - කායවිඤ්ඤාණ සිත් දසය (5x2) පමණි. මෙම සිත් දහයට (අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදි සිත් පහ සහ අහේතුක කුසල විපාක චක්ඛුවිඤ්ඤාණාදි සිත් පහ) ද්විපඤ්චවිඤ්ඤාණ (දෙපස් සිත්) ය යි ද කියනු ලැබේ.
2. චක්ඛුවිඤ්ඤාණාදි දෙපස් සිත්, විපාක සිත් ගණයට අයත් වන්නේ රූප දැකීම් ආදි වශයෙන් පහළ වන එම සිත් හැම විට ම ස්වකීය කැමැත්තට අනුව පහළ නො වන බැවිනි.
3. චක්ඛුවිඤ්ඤාණාදි දෙපස් සිත් ඒවා පහළ වන ප්‍රසාදරූප අනුව නම් කරනු ලැබුවත් හෘදයරූපය ආශ්‍රිත ව පහළ වන

සිත් බොහෝ බැවින් ඒවා නම් කරනු ලබන්නේ කෘත්‍ය අනුව ය.

**(ඊ.3) අහේතුක ක්‍රියා සිත් තුන**

1. උපේක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජනය
2. උපේක්ඛා සහගත මනෝද්වාරාවජ්ජනය
3. සෝමනස්ස සහගත හසිතුප්පාදය

*** විශේෂ කරුණු**

1. යම්කිසි කර්මයක විපාකයක් ද නො වන, විපාක උපදවන ස්වභාවය ඇති කර්ම සිතක් ද නො වන සිත් ක්‍රියා සිත් නමින් හැඳින්වේ. එයින් අදහස් වන්නේ කර්ම හෝ විපාක හෝ නො වන යම් කෘත්‍යයක් සිදු කරන සිත් යන්න යි.
2. සෝමනස්ස සහගත හසිතුප්පාද සිත පහළ වන්නේ බුදු, පසේබුදු, රහතන් වහන්සේලාට ය.
3. අකුසල් සිත් 12, අහේතුක සිත් 18 යන සිත් තිහට (30) අසෝභන සිත් ය යි කියනු ලැබේ.

## 1.I (ආ) කාමාවචර-සෝභන සිත් 24

**(ආ.1) කාමාවචර කුසල් සිත් 8**

1. සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත
2. සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත
3. සෝමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත
4. සෝමනස්ස සහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත
5. උපේක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත

6. උපේක්ඛා සහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත
7. උපේක්ඛා සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත
8. උපේක්ඛා සහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත

**(ආ.2) කාමාවචර සහේතුක විපාක සිත් 8**

1. සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත
2. සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත
3. සෝමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත
4. සෝමනස්ස සහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත
5. උපේක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත
6. උපේක්ඛා සහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත
7. උපේක්ඛා සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත
8. උපේක්ඛා සහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත

**(ආ.3) කාමාවචර සහේතුක ක්‍රියා සිත් 8**

1. සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත
2. සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත
3. සෝමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත
4. සෝමනස්ස සහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත
5. උපේක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත
6. උපේක්ඛා සහගත ඤාණසම්පයුත්ත සසඞ්ඛාරික සිත
7. උපේක්ඛා සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත
8. උපේක්ඛා සහගත ඤාණවිප්පයුත්ත සසඞ්ඛාරික සිත

*** විශේෂ කරුණු**

1. යමෙකුගේ සන්තානයෙහි ඇති වීමෙන් පසු එම සිත් පරපුරට ම අයත් ව අනාගතයෙහි ඉෂ්ටවිපාක ඇති කරන

සිත්වලට කුසල් සිත් ය යි ද එහි ආනිසංස වශයෙන් අනාගතයෙහි ඇති වන ඉෂ්ටවිපාකයන්ට විපාක සිත් ය යි ද තණ්හාව නැති කළ රහතන් වහන්සේලා සත්ක්‍රියාවන්හි යෙදෙන විට පහළ වන සිත්වලට ක්‍රියා සිත් ය යි ද කියනු ලැබේ. ඒ අනුව කාමාවචර කුසල් සිත් අට, කාමාවචර සහේතුක විපාක සිත් අට සහ සහේතුක කාමාවචර ක්‍රියා සිත් අට වශයෙන් කාමසෝභන සිත් විසිහතරකි.

2. මෙම සිත් සියල්ල වේදනා භේදයෙන් සෝමනස්ස-උපේක්ඛා වශයෙන් ද සඞ්කාර භේදයෙන් සසඞ්ඛාරික-අසඞ්ඛාරික වශයෙන් ද බෙදෙන අතර ප්‍රඥා චෛතසිකය යෙදුණු සිත් ඥානසම්ප්‍රයුක්ත ද ප්‍රඥා චෛතසිකය නො යෙදුණු සිත් ඥානවිප්පයුක්ත ද වේ.

3. කාමාවචර කුසල් සිත් අට 'මහාකුසල්' නාමයෙන් ද හැඳින්වේ. එසේ හඳුන්වනු ලබන්නේ සෙසු කුසල්වලට වඩා උසස් නිසා නොව ලොව බොහෝ දෙනෙකු තුළ පහළ වන නිසා ය. එම කුසල් සිත් අතරින් 'සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික' සිත සෙසු කුසල් සිත්වලට වඩා බලවත් ය.

4. ඤාණසම්පයුත්ත කුසල් සිත්වල අලෝභ, අදෝස, අමෝහ යන කුසල්මුල් තුන ම යෙදේ. ඒ අනුව එම ඤාණසම්පයුත්ත කුසල විපාක සිත්වල ද අලෝභ, අදෝස, අමෝහ යන කුසල්මුල් තුන ම විද්‍යමාන වන බැවින් එය ත්‍රිහේතුක කුසල විපාකයකි. ඤාණවිප්පයුත්ත කුසල් සිත්වල අමෝහය (ප්‍රඥාව) නො යෙදෙන බැවින් එබඳු කුසල් සිත්වල අලෝභ, අදෝස යන කුසල්මුල් දෙක පමණක් යෙදේ. ඒ අනුව ඤාණවිප්පයුත්ත කුසල විපාක

සිත්වල ද අලෝභ, අදෝස යන කුසල්මුල් දෙක පමණක් විද්‍යමාන වන බැවින් එය ද්විහේතුක කුසල විපාකයකි. එනිසා ඤාණසම්පයුත්ත (කර්ම-කර්මඵල විශ්වාසයෙන් සහ සම්මාදිට්ඨියෙන් යුතු ව) කුසල් කිරීමෙන් ත්‍රිහේතුක උත්කෘෂ්ට විපාක ලැබේ.

5. <u>ධ්‍යාන, මාර්ග-ඵලාදියට පත් විය හැක්කේ ත්‍රිහේතුක කුසල විපාකයකින් ප්‍රතිසන්ධිය ලැබූවෙකුට ය.</u> එනම්, ඥානසම්ප්‍රයුක්ත කුසල විපාකයකින් උපත ලැබූවෙකුට ම එම ජීවිතය තුළ ධ්‍යාන, මාර්ග-ඵල හිමි කර ගැනීමේ පුණ්‍යශක්තිය ඇත. අභිධර්මය නො දතුවන් නිවැරදි ව කරුණු වටහා නො ගෙන වැරදි ලෙස මෙය විවේචනය කරනු අසන්නට ලැබීම සංවේගයට කරුණකි.

## 1.II රූපාවචර කුසල - විපාක - ක්‍රියා සිත් 15

1. විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත ප්‍රථමධ්‍යාන
   කුසල් සිත / විපාක සිත / ක්‍රියා සිත.
2. විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත ද්විතීයධ්‍යාන
   කුසල් සිත / විපාක සිත / ක්‍රියා සිත.
3. පීති, සුඛ, ඒකග්ගතා සහිත තෘතීයධ්‍යාන
   කුසල් සිත / විපාක සිත / ක්‍රියා සිත.
4. සුඛ, ඒකග්ගතා සහිත චතුර්ථධ්‍යාන
   කුසල් සිත / විපාක සිත / ක්‍රියා සිත.
5. උපේක්ඛා, ඒකග්ගතා සහිත පඤ්චමධ්‍යාන
   කුසල් සිත / විපාක සිත / ක්‍රියා සිත.

* **විශේෂ කරුණු**

1. රූපාවචර කුසල විපාක සහ ක්‍රියා සිත් ඉහත දක්වන ලද ආකාරයෙන් ම වන බැවින් රූපාවචර සිත් සියල්ල (5x3=15) පසළොසකි.
2. රූපාවචර ක්‍රියා සිත් පහළ වන්නේ රහතන් වහන්සේලාට පමණි. මෙම සිත්වල 'සුඛ' යන්නෙන් ගැනෙන්නේ සෝමනස්සය යි. රූපාවචර සිත්වල අසඞ්ඛාරික-සසඞ්ඛාරික වශයෙන් විශේෂ භේදයක් නැතත් ස්වරූප බෙදීමෙහි දී මෙම සිත් සසඞ්ඛාරික වශයෙන් සලකනු ලැබේ.

## 1.III අරූපාවචර කුසල - විපාක - ක්‍රියා සිත් 12

1. ආකාසානඤ්චායතන කුසල් සිත / විපාක සිත / ක්‍රියා සිත
2. විඤ්ඤාණඤ්චායතන කුසල් සිත / විපාක සිත / ක්‍රියා සිත
3. ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත / විපාක සිත / ක්‍රියා සිත
4. නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිත / විපාක සිත / ක්‍රියා සිත

* **විශේෂ කරුණු**

1. අරූපාවචර කුසල් සිත්, විපාක සිත් සහ ක්‍රියා සිත් ඉහත දක්වන ලද පරිදි එම සමාපත්තියේ නමින් ම හැඳින්වෙන අතර ක්‍රියා සිත් පහළ වන්නේ රහතන් වහන්සේලාට පමණි. ඒ අනුව අරූපාවචර සිත් සියල්ල (4x3=12) දොළසකි.
2. මෙම සිත් උපේක්ෂා සහගත වන අතර ස්වරූප බෙදීමෙහි දී සසඞ්ඛාරික වශයෙන් සලකනු ලැබේ.


# 1.IV ලෝකෝත්තර සිත් 8

1. සෝතාපත්ති මාර්ග-සිත
2. සෝතාපත්ති ඵල-සිත
3. සකදාගාමී මාර්ග-සිත
4. සකදාගාමී ඵල-සිත
5. අනාගාමී මාර්ග-සිත
6. අනාගාමී ඵල-සිත
7. අර්හත් මාර්ග-සිත
8. අර්හත් ඵල-සිත

*** විශේෂ කරුණු**

1. සෑම මාර්ග-ඵල සිතක් ම පහළ වනුයේ ධ්‍යානසම්ප්‍රයුක්ත සිතක් වශයෙනි. මුලින් සමථ-ධ්‍යාන නො ලබා ශුෂ්කවිදර්ශනාවෙන් මාර්ග-ඵල ලබන යෝගාවචරයාගේ පවා එම මාර්ග-ඵල සිත් ප්‍රථමධ්‍යාන සම්ප්‍රයුක්ත වේ. එනිසා විස්තාර ක්‍රමයෙන් ලෝකෝත්තර සිත් ගණනය කරන විට රූපාවචර ධ්‍යාන 5 අනුව (8X5=40) සතළිසක් වේ. අරූපාවචර සමාපත්ති පාදක කරගෙන විදර්ශනා වඩා මාර්ගඵල ලබන යෝගාවචරයාගේ එම මාර්ගඵල සිත් පඤ්චමධ්‍යාන සම්ප්‍රයුක්ත වේ. ඒ අනුව විස්තාර ක්‍රමයෙන් සිත් සියල්ල 121 වන්නේ මෙසේ ය.

| | | |
|---|---|---|
| කාමාවචර සිත් | - | 54 |
| රූපාවචර සිත් | - | 15 |
| අරූපාවචර සිත් | - | 12 |
| ලෝකෝත්තර සිත් (8X5) | - | 40 |
| | | 121 |


සිත් 89/121
කාමාවචර සිත් 54
රූපාවචර සිත් 15
අරූපාවචර සිත් 12
ලෝකෝත්තර සිත් 8/40
කුසල් සිත් 5
විපාක සිත් 5
ක්‍රියා සිත් 5
කුසල් සිත් 4
විපාක සිත් 4
ක්‍රියා සිත් 4
මාර්ග සිත් 4/20
ඵල සිත් 4/20
අකුසල් සිත් 12
අහේතුක සිත් 18
සෝභන සිත් 24
ලෝභමූල සිත් 8
දෝසමූල සිත් 2
මෝහමූල සිත් 2
අකුසල විපාක සිත් 7
කුසල විපාක සිත් 8
ක්‍රියා සිත් 3
කුසල් සිත් 8
විපාක සිත් 8
ක්‍රියා සිත් 8

* **විශේෂ කරුණු**

1. සිත් පහළ වන්නේ ඇස, කන, නාසය, දිව, කය සහ ශුද්ධමනෝද්වාරය යන ද්වාර හය මුල් කර ගෙන ය. සිත් 89 අතරින් ඇස, කන, නාසය, දිව, කය ඇසුරින් පහළ වන්නේ සිත් 10 පමණි. සෙසු සිත් 79 මනෝද්වාරික ය.

(1) **ඇස**
- 1. අකුසල විපාක උපේක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණය
- 2. අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණය

(2) **කන**
- 1. අකුසල විපාක උපේක්ඛා සහගත සෝතවිඤ්ඤාණය
- 2. අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත සෝතවිඤ්ඤාණය

(3) **නාසය**
- 1. අකුසල විපාක උපේක්ඛා සහගත ඝානවිඤ්ඤාණය
- 2. අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත ඝානවිඤ්ඤාණය

(4) **දිව**
- 1. අකුසල විපාක උපේක්ඛා සහගත ජිව්හාවිඤ්ඤාණය
- 2. අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත ජිව්හාවිඤ්ඤාණය

(5) **කය**
- 1. අකුසල විපාක උපේක්ඛා සහගත කායවිඤ්ඤාණය
- 2. අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත කායවිඤ්ඤාණය

(6) **මනෝද්වාරය** - සෙසු සිත් 79

# 2. චෛතසික-පරමාර්ථය

අරමුණු දැනීම හෙවත් සිතක් පහළ වීම සමඟ ම සිදු වන අන්‍ය ක්‍රියා, 'චෛතසික' නමින් හැඳින්වේ. චෛතසිකයන්ට ආවේණික වූ ලක්ෂණ සතරකි. ඒවා නම්,

1. සිත සමඟින් එකට හටගැනීම **(ඒකුප්පාද)**
2. ඒ සිත සමඟින් එකට නිරුද්ධ (නැති) වීම **(ඒකනිරෝධ)**
3. සිත ගත් අරමුණ ම ගැනීම **(ඒකාලම්බන)**
4. සිත හටගන්නා තැන ම (ඉන්ද්‍රියෙහි ම) හටගැනීම **(ඒකවත්ථුක)**

මෙම ලක්ෂණ සතර 'සම්ප්‍රයෝග' හෙවත් 'වෙන් කළ නො හැකි ලෙස මිශ්‍ර වීමේ' ලක්ෂණ නමින් ද හැඳින්වෙන අතර චෛතසික සියල්ල දෙපණසකි (52). චෛතසික දෙපණස ම එක ම සිතක නො යෙදෙන අතර ඒ ඒ චෛතසික අදාළ සිත්වල පමණක් යෙදේ. එනිසා චෛතසික විභාගය පිළිබඳ මනා ලෙස කරුණු දැනගැනීමෙන් ඒ ඒ සිත්වල චෛතසික යෙදෙන අයුරු වටහා ගැනීම පහසු වේ. චෛතසික දෙපණස වර්ග කරනු ලබන්නේ පහත දැක්වෙන පරිද්දෙනි.

I. **අන්‍යසමාන රාශිය (13)** → (1) සර්වචිත්තසාධාරණ චෛතසික (7)
→ (2) ප්‍රකීර්ණක චෛතසික (6)

II. **අකුසල රාශිය (14)** → අකුසල චෛතසික (14)

III. **සෝභන රාශිය (25)** → (1) සෝභන සාධාරණ චෛතසික (19)
→ (2) අසාධාරණ සෝභන චෛතසික (6)

## 2.I අන්‍යසමාන රාශිය (13)

**I.(1) සර්වචිත්තසාධාරණ චෛතසික 7**

සෑම සිතක ම යෙදෙන චෛතසික හත මෙනමින් හැඳින් වේ.

I.(1)1. ඵස්ස - ඇස ආදි ඉන්ද්‍රියයකට රූපාදි අරමුණක් යොමු වූ විට එය සිතින් දැනගැනීමට නම් එම අරමුණ සිතට සම්බන්ධ විය යුතු ය. අරමුණ සිතෙහි හැපෙන්නාක් බඳු ව ඉන්ද්‍රිය, අරමුණ හා අදාළ සිත සම්බන්ධ වීමේ ගුණය මෙම ස්පර්ශ චෛතසික ය යි. මෙය නුවණින් ම වටහා ගත යුතු සූක්ෂ්ම චෛතසිකයකි.

I.(1)2. වේදනා - අරමුණෙහි රසය විඳින ස්වභාවය වේදනාව ය. අරමුණ ප්‍රියජනක වුවහොත් සුඛ/සෝමනස්ස වේදනා ද අරමුණ අප්‍රිය වුවහොත් දුක්ඛ/දෝමනස්ස වේදනා ද අරමුණ මධ්‍යස්ථ වුවහොත් උපේක්ෂා වේදනාව ද ඇති වේ. එය වනාහි මෙම වේදනා චෛතසිකය යි.

I.(1)3. සඤ්ඤා - ආරම්මණයෙහි ආකාරය ගන්නා ස්වභාවය සඤ්ඤාව යි. එය අරමුණු හැඳිනීම ලෙස ද දැක්විය හැකි ය.

I.(1)4. චේතනා - යෑම්, ඊම් ආදි නොයෙකුත් ක්‍රියා සිදු කිරීමේ උත්සාහය 'චේතනා' නමින් හැඳින් වේ. අරමුණු දැනීමට සිත ප්‍රධාන වන අතර ක්‍රියා සිදු කිරීමට චේතනාව ප්‍රධාන වේ. එනිසා

මෙම 'චේතනා' චෛතසිකයට 'කර්මය' ය යි ද කියනු ලැබේ.

I.(1)5. ඒකග්ගතා - සිතට අරමුණ ගත හැකි වන පරිදි අරමුණෙහි ඇති එක් ආකාරයක නො සැලෙන පරිදි මනා ලෙස සිත අරමුණෙහි පිහිටුවන ගුණය 'ඒකග්ගතා' නම්. දියුණු වූ ඒකග්ගතාව 'සමාධි' නමින් ද හැඳින් වේ.

I.(1)6. ජීවිතින්ද්‍රිය - නිවනට පැමිණීම දක්වා සත්ත්වයන්ගේ චිත්ත පරම්පරාව නො සිඳී පැවැත්මට උපකාර වන, එය පාලනය කරන ගුණය 'ජීවිතින්ද්‍රිය' චෛතසිකය යි.

I.(1)7. මනසිකාර - සිතට අරමුණෙන් ඉවත් වන්නට නො දී නැවත නැවත අරමුණු ගැනීමෙහි යොදවන ධර්මතාව මනසිකාරය යි.

**I.(2) ප්‍රකීර්ණක චෛතසික 6**

සෑම සිතක ම යෙදෙන්නේ නැති ව ඒ ඒ සිත්වල සුදුසු පරිදි යෙදෙන බැවින් මෙම චෛතසික හය 'ප්‍රකීර්ණක' නමින් හැඳින්වේ.

I.(2)1. විතක්ක - අරමුණ කරා යන, අරමුණට සිත නංවන ස්වභාවය 'විතක්ක' නම් වේ. කල්පනා කිරීම යනු ද මෙම විතක්කයට නමකි.

I.(2)2. විචාර - විතර්කය ගත් අරමුණ පිරිමදින හෙවත් එහි පැතිරෙන ස්වභාවය 'විචාර' යි.

I.(2)3. අධිමොක්ඛ - යම්කිසි එක් ආකාරයකින් සිතට අරමුණ

ගත හැකි වන පරිදි අරමුණේ ආකාරය විනිශ්චය කර ගන්නා ස්වභාවය 'අධිමොක්ඛ' නමි.

I.(2)4. විරිය - කටයුත්තෙහි නො පසුබසිමින් කටයුත්ත අවසන් වන තුරු ඉදිරියට යන ස්වභාවය 'වීර්යය' නම් වේ. කායික හා චෛතසික වශයෙන් වීර්යය දෙවැදෑරුම් වන අතර මෙයින් කියැවෙනුයේ චෛතසික වීර්යය යි.

I.(2)5. පීති - සිත පිනා යන ස්වභාවය 'පීති' ය යි.

I.(2)6. ඡන්‍ද - ඒ ඒ දේ කරනු කැමැත්ත, ඕනෑකම 'ඡන්ද' ය යි. එහෙත් ලෝභයෙහි මෙන් ඇලෙන ස්වභාවයක් ඡන්දයෙහි නැත.

*** විශේෂ කරුණු**

සර්වචිත්තසාධාරණ චෛතසික හත සහ ප්‍රකීර්ණක චෛතසික හය යන මෙම චෛතසික දහතුන අකුසල රාශියට හා සෝභන රාශියට අයත් චෛතසික සමඟ ද එක් ව යෙදෙන බැවින් 'අන්‍යසමාන' නමින් හැඳින් වේ.

## 2.II අකුසල රාශිය (14)

II.1. මෝහ - අරමුණෙහි සැබෑ තත්ත්වය වසන ස්වභාවය 'මෝහ' ය යි. අවිද්‍යාව නමින් හැඳින්වෙන්නේ ද මෙම මෝහය යි. මෙය සෑම අකුසල් සිතක ම යෙදෙන චෛතසිකයකි.

II.2. අහිරික - පාපය පිළිකුල් නො කරන ස්වභාවය හෙවත් පාපයට ලජ්ජා නො වන ස්වභාවය 'අහිරික' යි.

II.3. අනොත්තප්ප - පාපයට බිය නො වන ස්වභාවය 'අනොත්තප්ප' යි.

II.4. උද්ධච්ච - ආරම්මණයෙහි සිත මැනවින් නො පිහිටන, සැලෙන ස්වභාවය 'උද්ධච්ච' නමි. එනම් සමාධියට විරුද්ධ ස්වභාවය යි.

II.5. ලෝභ - අරමුණෙහි ඇලෙන ස්වභාවය 'ලෝභ' ය යි.

II.6. දිට්ඨි - යමක් වරදවා දකින ස්වභාවය 'දිට්ඨි' නමි. මෙයින් අදහස් කෙරෙන්නේ මිථ්‍යාදෘෂ්ටිය පිළිබඳ ව යි.

II.7. මාන - 'මේ මම' ය යනාදි වශයෙන් තමාගේ තත්ත්වය තමා විසින් මැන ගන්නා ස්වභාවය 'මාන' නමි.

II.8. දෝස - අරමුණට විරුද්ධ වන ස්වභාවය 'දෝස' ය යි. ක්‍රෝධය-වෛරය-බිය-අප්‍රසාදය වශයෙන් කියැවෙන්නේ ද එම ද්වේෂය ම ය.

II.9. ඉස්සා - අනුන්ගේ සැපයට හෝ සම්පත්තියට හෝ විරුද්ධ ස්වභාවය 'ඉස්සා' හෙවත් ඊර්ෂ්‍යාව යි.

II.10.මච්ඡරිය - තමා සතු දෙයක් අනෙකෙකුට අයිති වීම හෝ තමා අයත් දෙයකින් අනෙකෙකුට ප්‍රයෝජනයක් වීම හෝ නො ඉවසන්නා වූත් තමා සතු සම්පත් සඟවන්නා වූත් ස්වභාවය 'මච්ඡරිය' හෙවත් මසුරු බව යි.

II.11.කුක්කුච්ච - සිදු නො කළ කුසල් සහ කළ අකුසල් ගැන පසුතැවෙන ස්වභාවය 'කුක්කුච්ච' යි.

II.12.ථීන - සිතෙහි දුබල බව, අලස බව 'ථීන' ය යි.

II.13.මිද්ධ - චෛතසිකයන්ගේ දුබල බව, අලස බව 'මිද්ධ' ය යි. (මෙම ථීන-මිද්ධ දෙක නිසා වීර්යය හීන වන අතර ඇතැම් විට නිදිමත ද ඇති වෙයි.)

II.14.විචිකිච්ඡා - සියලු ම කුසලධර්මයන්ට, ධ්‍යාන, මාර්ගඵල ලැබීමට බාධක වූ සැකය 'විචිකිච්ඡා' නම්. 'බුද්ධාදි අටතැන සැකය' නමින් දැක්වෙන්නේ ද මෙය යි. නො දන්නා යමක් ගැන 'එසේ ද? මෙසේ ද' කියා ඇති වන සැකය මෙයට අයත් නො වේ.

## 2.III සෝභන රාශිය

### III.(1) සෝභන සාධාරණ චෛතසික

III.(1)1.සද්ධා - බුද්ධ-ධම්ම-සඞ්ඝ යන තෙරුවන කෙරෙහි ඇති වන විශ්වාසය, පැහැදීම, පිළිගැනීම 'සද්ධා' හෙවත් ශ්‍රද්ධාව යි.

III.(1)2.සති - අකුසලයට වැටෙන්නට නො දී සිත කුසලයෙහි පිහිටුවීම 'සති' හෙවත් සිහිය යි.

III.(1)3.හිරි - පාපයට ලජ්ජා වන, පාපය පිළිකුල් කරන ස්වභාවය 'හිරි' නම්.

III.(1)4.ඔත්තප්ප - පාපයට බිය වන ස්වභාවය 'ඔත්තප්ප' නම්.

III.(1)5.අලෝභ - අරමුණෙහි නො ඇලෙන ස්වභාවය 'අලෝභ' නම් වේ.

III.(1)6.අදෝස - ද්වේෂයට විරුද්ධ ස්වභාවය වූ මෛත්‍රිය 'අදෝස' නමි.

III.(1)7.තත්‍රමජ්ඣත්තතා - එකට හටගන්නා චිත්ත-චෛතසිකයන්ගේ වේගය අඩු වැඩි වන්නට නො දී සම ව පවත්වන ස්වභාවය 'තත්‍රමජ්ඣත්තතා' නමි.

III.(1)8.කායපස්සද්ධි - මෙහි ලා 'කාය' යනු චෛතසිකය. චෛතසිකයන්ගේ සන්සුන් බව 'කායපස්සද්ධි' නමි.

III.(1)9.චිත්තපස්සද්ධි - චිත්තයෙහි සන්සුන් බව 'චිත්තපස්සද්ධි' නමි.
(කායපස්සද්ධි සහ චිත්තපස්සද්ධි යන ධර්ම දෙක චිත්ත-චෛතසිකයන් නො සන්සුන් කරන උද්ධච්චාදි කෙලෙසුන්ට ප්‍රතිපක්ෂ චෛතසික දෙකකි.)

III.(1)10.කායලහුතා - චෛතසිකයන්ගේ සැහැල්ලු බව 'කායලහුතා' නමි.

III.(1)11.චිත්තලහුතා - සිතෙහි සැහැල්ලු බව 'චිත්තලහුතා' නමි.
(කායලහුතා සහ චිත්තලහුතා යන ධර්ම දෙක චිත්ත-චෛතසිකයන් බර බවට පමුණුවමින් දුර්වල කරන ථිනමිද්ධයට ප්‍රතිපක්ෂ ධර්ම දෙකකි.)

III.(1)12.කායමුදුතා - චෛතසිකයන්ගේ මෘදු, මොළොක් බව 'කායමුදුතා' නමි.

III.(1)13.චිත්තමුදුතා - සිතෙහි මෘදු, මොළොක් බව 'චිත්තමුදුතා' නමි.
(චිත්ත-චෛතසිකයන් තද බවට පත් කරන දෘෂ්ටි-මාන ආදියට ප්‍රතිපක්ෂ ධර්ම දෙකකි.)

III.(1)14.කායකම්මඤ්ඤතා- චෛතසිකයන්ගේ කර්මණ්‍යභාවය 'කායකම්මඤ්ඤතා' නමි.

III.(1)15.චිත්තකම්මඤ්ඤතා- සිතෙහි කර්මණ්‍යභාවය 'චිත්තකම්මඤ්ඤතා' නමි.
(චිත්ත-චෛතසිකයන් අකර්මණ්‍ය කරවන සෙසු නීවරණයන්ට ප්‍රතිපක්ෂ ධර්ම දෙකකි.)

III.(1)16.කායපාගුඤ්ඤතා- චෛතසිකයන් ඒ ඒ ක්‍රියාවන්හි ප්‍රගුණ බව 'කායපාගුඤ්ඤතා' නමි.

III.(1)17.චිත්තපාගුඤ්ඤතා - සිත ඒ ඒ ක්‍රියාවන්හි ප්‍රගුණ බව 'චිත්තපාගුඤ්ඤතා' නමි.
(චිත්ත-චෛතසිකයන් ගිලන් කර දුබල බවට පමුණුවන අශ්‍රද්ධාදි කෙලෙසුන්ට ප්‍රතිපක්ෂ ධර්ම දෙකකි.)

III.(1)18.කායුජ්ජුකතා - චෛතසිකයන්ගේ ඍජු බව 'කායුජ්ජුකතා' නමි.

III.(1)19.චිත්තුජ්ජුකතා - සිතෙහි ඍජු බව 'චිත්තුජ්ජුකතා' නමි.
(මෙම චෛතසික දෙක චිත්ත-චෛතසිකයන් වඞ්ක බවට

පමුණුවන මායා-සාඨෙයා ආදි කෙලෙස්වලට ප්‍රතිපක්ෂ ධර්ම දෙකකි.)

මෙම චෛතසික දහනවය සියලු ම සෝභන සිත්වල යෙදෙන බැවින් සෝභන-සාධාරණ නම් වේ.

**III.(2)** **අසාධාරණ සෝභන චෛතසික**

***විරති 3**

III.(2)1.සම්මාවාචා - බොරු කීම, කේලාම් කීම, පරුෂවචන කීම, හිස්වචන කීම යන වාග්දුශ්චරිතවලින් වැළකීම 'සම්මාවාචා' නමි.

III.(2)2.සම්මාකම්මන්ත - ප්‍රාණඝාතය, සොරකම් කිරීම, කාමයන්හි වරදවා හැසිරීම යන කායදුශ්චරිතවලින් වැළකීම 'සම්මාකම්මන්ත' නමි.

III.(2)3.සම්මාආජීව - දිවිපැවැත්ම සඳහා කරන කාය-වාග්දුශ්චරිතවලින් වැළකීම 'සම්මාආජීව' නමි.

මෙම චෛතසික තුන මුල් කොට ගෙන කාය-වාග්දුශ්චරිතවලින් වළකින බැවින් මෙම චෛතසික තුන 'විරති' නමි.

***අප්‍රමාණ්‍ය 2**

III.(2)4.කරුණා-අනුන්ගේ දුකට අකැමති වන, අනුන් දුකින් මුදවනු කැමැත්ත 'කරුණා' නම්.

III.(2)5.මුදිතා - අනුන්ට සම්පත් ලැබීමෙහි, අනුන්ගේ සැපතෙහි සතුටු වීම 'මුදිතා' නම්.

***පඤ්ඤා**

III.(2)6.පඤ්ඤා -අරමුණුවල තත්ත්වාකාරය ගැඹුරින් දක්නා ස්වභාවය 'ප්‍රඥාව' යි.

අසාධාරණ සෝභන-චෛතසික යෙදෙන්නේ ඒ ඒ සෝභන සිත් අනුව ය. සෝභන සාධාරණ හා අසාධාරණ චෛතසික සියල්ල එක් ව ගෙන මෙම චෛතසික ධර්ම විසිපහ සෝභන රාශිය නමින් හැඳින් වේ.

# චෛතසික සම්ප්‍රයෝගය

සෑම චෛතසිකයක් ම සෑම සිතක ම යෙදෙන්නේ නො වේ. ඒ ඒ සිත් අනුව චෛතසිකයන්ගේ යෙදීම චෛතසික සම්ප්‍රයෝගය යි. සර්වචිත්තසාධාරණචෛතසික හත සෑම සිතක ම යෙදේ. එහෙත් ප්‍රකීර්ණක චෛතසික යෙදෙන්නේ ඒ ඒ සිත් අනුව ය.


අකුසල චෛතසික අතරින් මෝහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච යන චෛතසික සතර සෑම අකුසල් සිතක ම යෙදෙන අතර ලෝභය හා ද්වේෂය එක ම අකුසල් සිතේ යෙදෙන්නේ නැත. ලෝභයෙන් අරමුණෙහි ඇලෙන අතර ද්වේෂයෙන් අරමුණෙහි ගැටේ. එනිසා ලෝභයත් ද්වේෂයත් එක ම සිතෙහි පහළ විය නො හැක.

සෝභන සාධාරණ චෛතසික දහනවය කෙටි ක්‍රමයෙන් පණස්නවයක් වූ ද විස්තර වශයෙන් අනූඑකක් වූ ද සියලු ම සෝභන සිත්වල යෙදේ. අසාධාරණ සෝභන චෛතසිකවලින් විරති චෛතසික තුන ම එකවර යෙදෙන්නේ ලෝකෝත්තර කුසල් සිත්වල පමණි. ලෞකික සිත්වලින් කාමාවචර සිත්වල විරති චෛතසික යෙදෙන්නේ වරකට එක බැගින් පමණි. උදාහරණ ලෙස සතුන් මැරීමෙන් වැළකීමෙහි දී යෙදෙන්නේ කායදුශ්චරිත-විරතිය පමණි. බොරු කීමෙන් වැළකීමෙහි දී යෙදෙන්නේ වචීදුශ්චරිත-විරතිය පමණි. වැරදි ජීවිකාවෙන් වැළකීමෙහි දී යෙදෙන්නේ මිච්ඡාජීව-විරතිය පමණි.

අප්‍රමාණ්‍ය චෛතසික දෙකින් කරුණා පූර්වභාගයෙහි දී කරුණා චෛතසිකය යෙදෙන අතර මුදිතා පූර්වභාගයෙහි දී මුදිතා චෛතසිකය යෙදේ. කාමාවචර ඥානසම්ප්‍රයුක්ත සිත්වල ද රූපාවචර, අරූපාවචර සහ ලෝකෝත්තර සිත්වල ද ප්‍රඥාව යෙදේ.

# චිත්තවීථි

රූප දැකීම්, ශබ්ද ඇසීම් ආදිය සහ සිතින්, කයින්, වචනයෙන් සිදු කරන විවිධ ක්‍රියාකාරකම් කෙරෙනුයේ එක් සිතකින් නො වේ. ඒ සෑම ක්‍රියාකාරකමක් ම සිදු වීමට ක්‍රමානුකූල ව සිත් පෙළක් හෙවත් සිත් වැලක් පහළ විය යුතු ය. ඒ සිත් පෙළ හෙවත් සිත්වැල 'චිත්තවීථි' නමින් හැඳින්වේ. සිතක ආයුකාලය ඉතා සුළු ය. සිතක් උපදින කාලය - සිත පවත්නා කාලය - සිත නැසෙන කාලය වශයෙන් සිත් පිළිබඳ අවස්ථා තුනක් ඇත. ඒවා හැඳින්වෙන්නේ උත්පාදක්ෂණ - ස්ථිතික්ෂණ - භඞ්ගක්ෂණ නමිනි. සිතෙහි උත්පාද - ස්ථිති - භඞ්ග ක්ෂණ තුන කාල වශයෙන් සමාන ය. එම කාල තුන එක්කොට 'චිත්තක්ෂණය' නමින් හැඳින්වෙන අතර එහි අරුත සිතක ආයුකාලය යනු යි. මෙබඳු චිත්තක්ෂණ දහතක් රූපයේ ආයුෂ යි. එනම් කුඩා චිත්තක්ෂණ පණස් එකක කාලය යි. එහි පළමුවන කුඩා චිත්තක්ෂණය, රූපයේ උත්පාදක්ෂණය වන අතර පණස්එක්වැන්න භඞ්ගක්ෂණය වෙයි. කුඩා චිත්තක්ෂණ හතළිස්නවයක් රූපයේ ස්ථිතිය වේ. එය ප්‍රස්තාර ගත කර දක්වන්නේ නම්, මෙසේ දැක්විය හැකි ය.




මෙයින් දක්වෙන්නේ චක්ඛුද්වාරික චිත්තවීථිය පිළිබඳ දළ සටහනකි. උප්පාද-ඨිති-භඞ්ග වශයෙන් කුඩා චිත්තක්ෂණ

තුනකින් මහාචිත්තක්‍ෂණයක් සෑදේ. මෙම මහා චිත්තක්‍ෂණ දහත රූපයේ ආයුෂ යි. මෙම චිත්තක්‍ෂණ දහත මෙසේ යි.

1. භවාඞ්ග
2. භවාඞ්ග-චලන
3. භවාඞ්ග-උපච්ඡේද
4. පඤ්චද්වාරාවජ්ජන
5. චක්ඛුවිඤ්ඤාණ
6. සම්පටිච්ඡන
7. සන්තීරණ
8. වොත්ථපන
9. ජවන - 1
10. ජවන - 2
11. ජවන - 3
12. ජවන - 4
13. ජවන - 5
14. ජවන - 6
15. ජවන - 7
16. තදාරම්මණ - 1
17. තදාරම්මණ - 2

සිත් නිරන්තරයෙන් ඇති වී පැවතී නැති වී යන්නේ එක්තරා පිළිවෙළකට ය. මෙසේ ඒ ඒ ක්‍රියා සිදු කිරීම් වශයෙන් පහළ වන සිත් පෙළ 'චිත්තවීථි' නම්. චිත්තවීථි පහළ වීම සම්බන්ධයෙන් දැක්විය යුතු කරුණු රාශියක් ඇතත් මෙහි ලා ඊට අවකාශ නැති බැවින් අතිපූජනීය රේරුකානේ චන්දවිමල

මහානාහිමිපාණන් වහන්සේ විසින් සම්පාදිත 'අභිධර්ම මාර්ගය' ග්‍රන්ථය ඇසුරින් එම කරුණු වැඩි දුරටත් උගත යුතු ය.

## භවාඞ්ග සිත්

යම්කිසි භවයක ප්‍රතිසන්‍ධිය ලැබීම් වශයෙන් ප්‍රථමයෙන් ම පහළ වන විපාක සිත, 'ප්‍රතිසන්‍ධි සිත' නමින් හැඳින්වේ. එතැන් පටන් එම ජීවිතයෙහි මරණය තෙක් වීථි සිත් පහළ නො වන අවස්ථාවන්හි චිත්ත පරම්පරාව නො සිඳී පැවතීම් වශයෙන් ප්‍රතිසන්‍ධි-සිතට සමාන සිතක් නැවත නැවත ඇති වේ. සිත් පරම්පරාව නො සිඳී සත්ත්‍වයාගේ ජීවිතය පවත්වමින් භවයේ පැවැත්මට කාරණය (හේතුව) වන එම සිත්වලට <u>**'භවාඞ්ග සිත්'**</u> ය'යි කියනු ලැබේ. වීථි සිත් පහළ නො වන අවස්ථාවන්හි නිරතුරු ව ම භවාඞ්ග සිත් පහළ වුව ද සත්ත්‍වයාට එබඳු සිතක් ඇති වන බව දැනෙන්නේ නැත. එම භවාඞ්ගචිත්තය සත්ත්‍වයාගේ 'මූලචිත්තය' නමින් ද හැඳින්වේ. අලුතින් අරමුණු ගන්නා වීථි හෙවත් සිතිවිලි පහළ වන්නේ භවාඞ්ග සිත් පරම්පරාවේ අගින් ය.

භවයක ආරම්භයෙහි දී පහළ වන ප්‍රතිසන්‍ධි සිතත් එම භවයේ භවාඞ්ග සිතත් එම භවය අවසානයෙහි පහළ වන ච්‍යුති සිතත් එක හා සමාන සිත් ය. එම ප්‍රතිසන්‍ධි - භවාඞ්ග - ච්‍යුති චිත්තයන් 'වීථිමුක්ත සිත්' නමින් හැඳින් වේ.

රූප-ශබ්ද-ගන්ධ-රස-පහස හා මනෝද්වාරික අරමුණු චිත්තසන්තතියට යොමු වූ කල්හි භවාඞ්ග සිත් පහළ වීම නැවතී චිත්තසන්තතියට යොමු වූ අරමුණ අනුව වීථි සිත් පහළ වේ. එසේ පහළ වන වීථි සිත් අතර ඇති ජවන් සිත්වල චේතනා

මඟින් කර්ම රැස් වීම සිදු වේ. එක් චිත්තවීථියක ජවන් සිත් සතක් අනුපිළිවෙළින් පහළ වේ. 'ජවන' යනු වේගවත් ක්‍රියාකාරී සිත් ය. සත්ත්වයාගේ සිත, කය, වචනය ක්‍රියාකාරී වෙමින් කර්ම රැස්වන්නේ හෝ ක්‍රියා සිදු කළ හැක්කේ මෙම ජවන සිත්වල චේතනාව මුල් වීමෙනි. කෙලෙස් සහිත සත්ත්වයන්ගේ කුසල හෝ අකුසල ජවන සිත්වල චේතනා මඟින් කර්මවිපාක ලබා දෙන්නේ මෙසේ ය.

1. ජවනය ⟶ දිට්ඨධම්මවේදනීය විපාක
2. ජවනය }
3. ජවනය }
4. ජවනය } අපරාපරියවේදනීය විපාක
5. ජවනය }
6. ජවනය }
7. ජවනය ⟶ උපපජ්ජවේදනීය විපාක

**ජවන කෘත්‍යය සිදු කරන සිත් නම්,**

| | | |
|---|---|---|
| 1. | අකුසල් සිත් | 12 |
| 2. | හසිතුප්පාද සිත | 1 |
| 3. | මහාකුසල් සිත් | 8 |
| 4. | මහා ක්‍රියා සිත් | 8 |
| 5. | මහග්ගත කුසල් සිත් | 9 |
| 6. | මහග්ගත ක්‍රියා සිත් | 9 |
| 7. | ලෝකෝත්තර සිත් | 8 |
| | | 55 |

මෙම සිත් පණස්පහ ජවන කෘත්‍යය සිදු කරන සිත් ය. එයින් ලෝකෝත්තර සිත් 8, මහාක්‍රියා සිත් 8, මහග්ගත ක්‍රියා සිත් 9 සහ හසිතුප්පාද සිත යන සිත් විසිහය හැර ඉතිරි සිත් විසිනවය (එනම්, අකුසල් සිත් 12, මහාකුසල් සිත් 8, මහග්ගත කුසල් සිත් 9) මගින් කර්ම රැස් වීම සිදු වේ.

## මරණාසන්න ජවන වීථිය

මරණින් මතු ප්‍රතිසන්ධියක් ලබන්නහුගේ එනම්, රහත් නො වූ සැමගේ එම ජීවිතයේ  ච්‍යුතිචිත්තය පහළ වීමට පෙර මරණාසන්න ජවන චිත්තවීථියට, ඊළඟ භවයෙහි ප්‍රතිසන්ධිය සඳහා හේතු වන කර්මය හෝ එම කර්ම සිදු කිරීමට උපකාරී වූ දේ ඇසුරින් 'කර්මනිමිත්ත' හෝ මතු පහළ වන භවය සම්බන්ධ වූ 'ගතිනිමිත්ත' හෝ අරමුණු වේ.

මේ පිළිබඳ ව අතිපූජනීය රේරුකානේ චන්දවිමල මහානාහිමිපාණන් වහන්සේ විසින් 'අභිධර්ම මාර්ගය' ග්‍රන්ථයෙහි විස්තර කරනු ලැබ ඇත්තේ මෙසේ ය.

සිත්වලට ආධාර වන වස්තුරූප පරම්පරාවන් සිඳියන්නට හොඳට ම ළං වූ කල්හි මැරෙන සත්ත්වයාට ඒ අවස්ථාවෙහි දී වැටහී තිබූ කර්මාදියෙන් එකක් අරමුණු කොට ඒ ශරීරයෙහි ඇති වන අන්තිම චිත්තවීථිය ඇති වේ. එයට 'මරණාසන්නචිත්තවීථිය' යි කියනු ලැබේ. මේ අවස්ථාවේ දී චිත්තවේගය ඉතා හීන බැවින් ප්‍රකෘති කාලයෙහි මෙන් ඒ වීථියේ ජවන් සතක් ඇති නො වී, පසක් පමණක් ඇති වේ. පස්වන ජවනයට අනතුරු ව හෝ ජවනයෙන් පසු භවාඞ්ගයක් වී එයට අනතුරු ව හෝ තදාරම්මණයට අනතුරු ව හෝ තදාරම්මණයෙන්

පසු භවාඞ්ග වී එයට අනතුරු ව හෝ වර්තමාන භවයාගේ අවසාන චිත්තය වන ච්‍යුතිචිත්තය උපදී. ඉන්පසු කිසි කලෙක ඒ ශරීරයේ නැවත සිත් ඇති නො වේ. ච්‍යුතිචිත්තය ඇති වීම සත්ත්වයාගේ මරණය ය.

ච්‍යුතියෙන් පසු ඒ ශරීරයෙහි නැවත සිත් ඇති නො වන නමුත් සත්ත්වයාගේ සිත් පරම්පරාව නො සිඳේ. ච්‍යුතිචිත්තය නිරුද්ධ වනු සමඟ ම මරණාසන්න ජවන් විසින් ගන්නා ලද අරමුණ අනුව යම්කිසි තැනක දෙවන ජාතියේ පළමුවන සිත වන ප්‍රතිසන්ධිචිත්තය පහළ වේ. ඒ ප්‍රතිසන්ධිචිත්තය පහළ වීම මළ සත්ත්වයාගේ නැවත ඉපදීම ය. මැරෙන තැනැත්තාගේ ශරීරයෙන් කිසිවක් අනාගත භවයට නො යන්නේ ය. ප්‍රතිසන්ධිචිත්තය වර්තමාන භවයෙන් එහි ගිය එකක් නොව, එහි ම අලුතෙන් පහළ වූවකි.

ප්‍රතිසන්ධිචිත්තය වර්තමාන භවයෙන් අනාගතභවයට ගිය එකක් නො වතුදු වර්තමාන භවයේ පැවති සිත් පරම්පරාවට ම අයත් දෙයකි. වර්තමාන භවයට අයත් සිත් පරම්පරාව නො වී නම් ප්‍රතිසන්ධිචිත්තයක් ඇති නො වේ. ච්‍යුති-ප්‍රතිසන්ධි දෙක අතර දීර්ඝකාලයක් ද නැත. ච්‍යුතියට අනතුරු ව ප්‍රතිසන්ධිය ඇති වීමට ගත වන කාලයත් ජීවත් ව ඉන්නා කාලයේ චිත්තවීථියක එක් සිතක් නිරුද්ධ වී තවත් සිතක් ඇති වීමට ගත වන කාලයත් එකසමාන ය. උදාහරණයක් ලෙස මිනිසකු මැරී දෙව්ලොව පිළිසිඳ ගත් කල්හි, මේ ලෝකයෙන් දෙව්ලොවට ගිය කිසිවෙක් නැත ද, දෙවියාගේ ප්‍රතිසන්ධිචිත්තය මිය ගිය මිනිසාගේ සිත් පරම්පරාවට ම අයත් බැවින් මිය ගිය මිනිසාත් ඒ දෙවියාත් එක් පුද්ගලයකු වශයෙන් කිය යුතු ය.

ච්‍යුතියට අනතුරු ව ප්‍රතිසන්ධිචිත්තය ඇති වීමේ ප්‍රධාන

හේතුව, විපාක දීමට එළඹ සිටි අතීත කර්මය ය. මරණාසන්නයේ දී කර්මාදියෙන් එකක් අරමුණු කරමින් පැවති කුශලාකුශල ජවන චිත්තයන් හා අවිද්‍යා, තෘෂ්ණා දෙකත් ඒ ඒ ආකාරයෙන් ප්‍රතිසන්ධියට හේතු වේ.

(මරණාසන්න ජවනවීථියට අනතුරු ව එම ජීවිතයෙහි අවසන් සිත වන ච්‍යුතිචිත්තයත් ඉන් අනතුරු ව අනතුරු භවයෙහි ප්‍රතිසන්ධිචිත්තයත් චිත්තනියාමය අනුව යෙදෙන බැවින් මෙහි ලා **අන්තරාභවයකට ඉඩ නැති බව ඉතාමත් පැහැදිලි ය.**)

කාමාවචර ප්‍රතිසන්ධියක් සඳහා කර්ම - කර්මනිමිති - ගතිනිමිති යන තුනෙන් කවරක් හෝ මරණාසන්න චිත්තවීථියට අරමුණු විය හැකි ය.

1. **කර්ම** - වර්තමාන භවයෙහි දී හෝ අතීත භවවල දී හෝ ඒ පුද්ගලයා විසින් සිදු කර ඇති කුසල - අකුසල කර්ම.
2. **කර්ම නිමිති** - කර්මයට අරමුණු වූ හෝ එය සිදු කිරීමට උපකරණ වූ හෝ වස්තු.
3. **ගති නිමිති** - මතු භවය සම්බන්ධ විවිධ දේ.

අසංඥතලයෙහි උපදින සත්ත්වයන්ට ච්‍යුතියෙන් පසු ප්‍රතිසන්ධිචිත්තයක් පහළ නො වන අතර පූර්ව කර්මයේ බලයෙන් ජීවිතනවක රූපකලාප පමණක් ඇති වේ. මෙසේ කල්ප පන්සියයක් පමණ වූ දිගු කාලයක් අසංඥභූමියෙහි ගත කොට ච්‍යුත වන්නා වූ එම පුද්ගලයාට ච්‍යුතිචිත්තයක් පහළ වන්නේ ද නැත. අවසන්වරට ඔහුට පහළ වන ජීවිතනවක රූප කලාප ම ඔහුගේ ච්‍යුතිය වේ. කර්ම - කර්මනිමිති - ගතිනිමිති

වැටහීමක් ද ඔහුට නැත. අසංඥභවයට පැමිණීමට පෙර ඔහු විසින් ලබා සිටි පඤ්චමධ්‍යානයේ උපචාර චේතනාවෙන් මතුකර දෙන කර්මාදිය අතුරෙන් එකක් අරමුණු කොට අසංඥසත්ත්ව-ච්‍යුතියෙන් පසු ඔහුට කාමාවචර ප්‍රතිසන්ධියක් ඇති වේ.

රූපාවචර, අරූපාවචර ප්‍රතිසන්ධීන්ට අරමුණු වන්නේ 'කර්මනිමිත්ත' පමණි. ඔවුන්ට කර්මනිමිත්ත වශයෙන් අරමුණු වන්නේ ද ඔවුන් ලබා සිටිනා ධ්‍යානවලට අරමුණු වන කසිණ නිමිත්තාදිය ය. අරූපාවචර-ච්‍යුති සතරෙන් පසු ඉන් යට අරූපාවචර-ප්‍රතිසන්ධි හැර ඉතිරි අරූපාවචර-ප්‍රතිසන්ධි හා කාමත්‍රිහේතුක-ප්‍රතිසන්ධි ද ඇතිවිය හැකි ය. ඉහළ අරූපභූමියකින් ච්‍යුත වූවෙකුට පහළ අරූප-ප්‍රතිසන්ධියක් ඇති නො වේ. අරූපභූමි සියල්ලෙන් ම ච්‍යුතවන්නවුන්ට රූපාවචර-ප්‍රතිසන්ධි හෝ කාමාවචර අහේතුක, ද්විහේතුක හෝ ප්‍රතිසන්ධි ඇති නො වේ. රූපාවචර-ච්‍යුතීන්ගෙන් අනතුරු ව අහේතුක-ප්‍රතිසන්ධි හැර ඉතිරි ප්‍රතිසන්ධි ඇති විය හැකි ය. ද්විහේතුක, අහේතුක ච්‍යුතීන්ගෙන් පසු ඇති විය හැක්කේ කාමාවචර-ප්‍රතිසන්ධි පමණි.

අසංඥභවයෙහි ප්‍රතිසන්ධිය වශයෙන් ඇතිවන්නේ ජීවිතනවක රූපකලාප පමණක් බැවින් ඔවුහු රූපප්‍රතිසන්ධිකයෝ ය. අරූපභූමියෙහි උපදනා සත්ත්වයෝ අරූපප්‍රතිසන්ධිකයෝ ය. සෙසු සත්ත්වයෝ සියලුදෙන රූපාරූපප්‍රතිසන්ධිකයෝ ය.

# 3. රූප-පරමාර්ථය

පරමාර්ථධර්ම සතර අතරින් තුන්වන පරමාර්ථය රූපපරමාර්ථය යි. ශීත-උෂ්ණාදිය නිසා නිරන්තරයෙන් වෙනස්වන භෞතික ධර්මතා කොටස රූපය යි (රුප්පතීති රූපං). පරමාර්ථ-රූප වශයෙන් රූප විසිඅටක් ඇත. ඒවා නම්,

1. පඨවීධාතු
2. ආපෝධාතු
3. තේජෝධාතු
4. වායෝධාතු

} මහාභූත-රූප 04

5. චක්ඛුප්පසාද
6. සෝතප්පසාද
7. ඝාණප්පසාද
8. ජිව්හාප්පසාද
9. කායප්පසාද

} ප්‍රසාද-රූප 05

10. රූප (වර්ණරූපය)
11. සද්ද
12. ගන්ධ
13. රස

} ගෝචර-රූප 04

(ඵොට්ඨබ්බ හෙවත් ස්පර්ශය වන්නේ පඨවී-තේජෝ-වායෝ යන ධාතු තුන ය.)

14. ඉත්ථිභාව (ස්ත්‍රීභාව-රූප)
15. පුම්භාව (පුරුෂභාව-රූප)

} භාව-රූප 02

16. හදය-රූප
17. ජීවිතින්ද්‍රිය-රූප
18. ආහාර-රූප
19. පරිච්ඡේද-ආකාස-රූප

<table>
<tr><td>20. කායවිඤ්ඤත්ති</td><td rowspan="2">විඤ්ඤත්ති-රූප 02</td><td rowspan="5">විකාර-රූප 05</td></tr>
<tr><td>21. වචීවිඤ්ඤත්ති</td></tr>
<tr><td>22. ලහුතා</td><td rowspan="3">ලහුතාදි රූප 03</td></tr>
<tr><td>23. මුදුතා</td></tr>
<tr><td>24. කම්මඤ්ඤතා</td></tr>
</table>

<table>
<tr><td>25. උපචය</td><td rowspan="4">ලක්ඛණ-රූප 04</td></tr>
<tr><td>26. සන්තති</td></tr>
<tr><td>27. ජරතා</td></tr>
<tr><td>28. අනිච්චතා</td></tr>
</table>

පරමාර්ථ රූප විසිඅටක් වුව ද එක් පුද්ගලයකු තුළ උපරිම වශයෙන් පැවතිය හැක්කේ රූප විසිහතක් පමණි. ස්ත්‍රී හා පුරුෂ භාවරූප දෙක ම එක්වර එක් අයෙකු තුළ පිහිටන්නේ නැත.

### 01) මහාභූත-රූප සතර (1, 2, 3, 4)

ලොව ඇති සියලු රූපයන්ගේ මූලික පදනම පඨවී, ආපෝ, තේජෝ, වායෝ යන මහාභූත සතර ය. 'පඨවීධාතු' යනු රූපයන්ගේ තද-මොළොක්-රළු-සිනිඳු-බර-සැහැල්ලු ස්වභාවය යි. 'ආපෝධාතු' යනු රූප එකට බඳවන,

කැටිකරන-වැගිරෙන ස්වභාවය යි. 'තෝජෝධාතු' යනු උණුසුම-සිසිල දෙක ය. 'වායෝධාතු' යනු පුම්බවන, චලනය වන ස්වභාවය යි. මෙයින් ආපෝධාතුව දැකීමට හෝ ස්පර්ශ කිරීමට නො හැකි අතර ස්පර්ශ කළ හැක්කේ පඨවී-තේජෝ-වායෝ යන ධාතු තුන ය. එනිසා අභිධර්මයෙහි ගෝචර-රූප අතර ඵොට්ඨබ්බ (ස්පර්ශ) යනුවෙන් වෙන ම රූපයක් නැති අතර ස්පර්ශ වන්නේ පඨවී - තේජෝ - වායෝ ධාතු තුන ය. පඨවී - ආපෝ - තේජෝ - වායෝ යන ධාතු සතර මෙන් ම වණ්ණ - ගන්ධ - රස -ඕජා යන රූප සතර ද වෙන් ව නො පවතී. පඨවී - ආපෝ - තේජෝ - වායෝ - වණ්ණ - ගන්ධ - රස -ඕජා යන රූප අට සෑම විට ම එක ම මිටියක් හෙවත් කලාපයක් වශයෙන් බැඳී පවත්නා බැවින් ඊට 'ශුද්ධාෂ්ටක රූපකලාප' ය යි කියනු ලැබේ. එසේ ම එම රූප එකිනෙක වෙන් කළ නො හැකි බැවින් අවිනිබ්භෝග-රූප ය යි ද කියනු ලැබේ. බාහිර පරිසරයේ පවතින ගහ-කොළ-පර්වත-ගඞ්ගා-ඉර-සඳ ආදී සෑම වස්තුවක් ම මෙම ශුද්ධාෂ්ටක රූපකලාපවලින් සෑදී ඇති අතර ඇතැම් විටක ශබ්ද-රූපයත් ඇතුළත් ව සද්දනවකකලාප වශයෙන් ද පවතී.

**02) ප්‍රසාද-රූප පස (5, 6, 7, 8, 9)**

රූප - ශබ්ද - ගන්ධ - රස - පහස යන ගෝචර රූප විෂය කර ගනිමින් සිත් පහළ වීමට ආධාර වන රූප, 'ප්‍රසාද-රූප' නම්. ප්‍රසාද-රූප නම්, ඉතා සියුම් වූ ඇසට නො පෙනෙන අතට හසු නො වන කර්මයෙන් නිපන් ඔපයක් බඳු රූප කොටසකි. චක්ඛුවිඤ්ඤාණය පහළ වීමට උපකාර වන ඇසේ

පිහිටි ප්‍රසාද-රූප, 'චක්ඛුප්පසාද' නම්. සෝතවිඤ්ඤාණය පහළ වීමට උපකාර වන කනෙහි පිහිටි ප්‍රසාද-රූප, 'සෝතප්පසාද' නම්. ඝානවිඤ්ඤාණය පහළ වීමට උපකාර වන නාසයෙහි පිහිටි ප්‍රසාද-රූප, 'ඝානප්පසාද' නම්. ජිව්හාවිඤ්ඤාණය පහළ වීමට උපකාර වන දිවෙහි පිහිටි ප්‍රසාද-රූප, 'ජිව්හාප්පසාද' නම්. කායවිඤ්ඤාණය පහළ වීමට උපකාර වන කයෙහි පිහිටි ප්‍රසාද-රූප, 'කායප්පසාද' නම්. මෙම ප්‍රසාද-රූප පහළ වන්නේ රූපාදි අරමුණු දැනගැනීමේ තෘෂ්ණාව සමඟ නිපන් කර්මශක්තියෙනි. කාමධාතුවෙහි උපදින සත්ත්වයන්ට බොහෝ සෙයින් මෙම ප්‍රසාද-රූප පහ ම ලැබෙන අතර ඇතැම් කෙනෙකුට ස්වකීය කර්මවිපාක අනුව ඇතැම් ප්‍රසාද-රූප ලැබීම සීමා වේ. උදාහරණයක් ලෙස ඇතැම් කෙනෙක් පුරාණ කර්මවිපාකයක් නිසා උපතින් අන්ධයෙකු ලෙස උපත ලබයි. ඒනිසා ඔහුට ඇස් පෙනෙන්නේ නැත.

අසංඥතලය හැර සෙසු රූපාවචර බ්‍රහ්මලෝක පසළොසෙහි බ්‍රහ්මයන්ට ප්‍රසාද-රූප වශයෙන් චක්ඛුප්පසාද - සෝතප්පසාද යන ප්‍රසාද-රූප පමණක් ලැබෙන අතර රූපාවචර බ්‍රහ්මයන්ට ආයතන වශයෙන් ලැබෙන්නේ චක්ඛායතන, සෝතායතන, මනායතන යන ආයතන තුන පමණි. අසංඥතලයෙහි සත්ත්වයන්ට කර්මජ ශුද්ධාෂ්ටක-රූපකලාප පමණක් හටගනී. අරූපතලයෙහි පහළ වූ බ්‍රහ්මයන්ට කිසිදු රූපයක් හට නො ගනී. එක ම මනායතනය පමණක් පවතී.

**03) ගෝචර-රූප සතර (10, 11, 12, 13)**

රූප - ශබ්ද - ගන්ධ - රස - ස්පර්ශ වශයෙන් ගෝචර රූප පසක් වුව ද පරමාර්ථ වශයෙන් ලැබෙන්නේ රූප සතරක් පමණි.

ඇසට පෙනෙන්නේ පරමාර්ථ රූපයන්ගෙන් වර්ණ-රූපය පමණි. එසේ ම කනට ඇසෙන්නේ ශබ්ද-රූපය යි. නාසයෙන් ආඝ්‍රාණය කළ හැක්කේ ගන්ධ-රූපය යි. දිවෙන් දැන ගත හැක්කේ රස රූපය යි. කයට දැනෙන පහස වනාහි පඨවී - තේජෝ - වායෝ ධාතු තුන ය.

**04) භාව-රූප දෙක (14, 15)**

ස්ත්‍රීභාව-රූප (ඉත්ථින්ද්‍රිය), පුරුෂභාව-රූප (පුරිසින්ද්‍රිය) වශයෙන් භාව-රූප දෙකකි. භාව-රූප හටගන්නේ පටිසන්ධිචිත්තයත් සමඟ ය. ස්ත්‍රීභාව-රූප ඇති ශරීරය ස්ත්‍රී ආකාරයෙන් ද පුරුෂභාව-රූප ඇති ශරීරය පුරුෂ ආකාරයෙන් ද සකස් වේ. බ්‍රහ්මලෝකයන්හි ස්ත්‍රී-පුරුෂ භේදයක් නැත.

**05) හෘදයවස්තු-රූපය (16)**

ප්‍රසාද-රූප ඇසුරු කොට පහළ වන චක්ඛුවිඤ්ඤාණාදි ද්විපඤ්ච-විඤ්ඤාණ හැර සෙසු සිත් පහළ වන්නේ හෘදයවස්තු-රූපය ඇසුරු කර ගෙන ය. එම වස්තු-රූප හෘදයකෝෂයෙහි ඇති ලේ ඇසුරු කර ගෙන පවතී. අරූපතලයෙහි හෘදයවස්තු-රූපයක් නැති ව ම සිත් පහළ වේ.

**06) <u>ජීවිතින්ද්‍රිය-රූපය (17)</u>**

අතීත කර්මයක් නිසා හටගත් කර්මජ-රූප පරම්පරාව පවත්වන, ආරක්‍ෂා කරන, ජීවත් කරවන රූපය ජීවිතින්ද්‍රිය-රූප නම් වේ. ජීවිතින්ද්‍රිය-රූපයේ බලයෙන් කර්මජ-රූප වර්ෂ සියදහස්ගණනක් වුව ද පරම්පරාව නො සිඳී පවතී.

**07) ආහාර-රූපය (18)**

ශරීරය ශක්තිමත් කරවන විශේෂ රූප කොටසක් උපද්දවන ආහාරයන්හි ඕජාව වනාහි ආහාර-රූපය යි.

**08) පරිච්ඡේද-ආකාස-රූපය (19)**

ඝනවස්තූන්හි ඇති රූපකලාප ඔවුනොවුන්ගෙන් වෙන් කරන ආකාශය 'පරිච්ඡේද-ආකාස-රූප' නම්. මෙය වෙන් වූ ඉපදීමක් ඇති පරමාර්ථධර්මයක් නො වේ. එහෙත් රූපකලාපවල අමිශ පැවැත්මට ඒවා අතරට ආකාශයක් අවශ්‍ය බැවින් එය එක් රූපයක් ලෙස ගණන් ගනු ලැබේ.

**09) විකාර-රූප පස (20, 21, 22, 23, 24)**

විඤ්ඤත්ති-රූප දෙක සහ ලහුතා ආදි රූප තුන වශයෙන් විකාර-රූප පසකි.

**අ) විඤ්ඤත්ති-රූප දෙක (21, 21)**

ශරීරාවයව ක්‍රියා කරවන චිත්තජ වායෝධාතුව සමඟ ම ඇති වී අවශ්‍ය ආකාරයට කායික චලන ඇති කරවනු පිණිස එම වාතය මෙහෙයවනු ලබන්නේ කායවිඤ්ඤත්ති-රූපයෙනි. කථා කිරීම සඳහා අක්‍ෂර -

වචනාදිය ප්‍රකාශ වන පරිදි එම ශබ්දය මෙහෙයවනු ලැබෙන්නේ වචීවිඤ්ඤත්ති-රූපයෙනි.

**ආ) ලහුතාදි රූප 3 (23, 24)**

ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යනුවෙන් හැඳින්වෙන රූප වනාහි විඤ්ඤත්ති-රූප සේ ම වරින් වර රූපකයෙහි ඇති වන ආකාර විශේෂයකි. 'ලහුතා' යනු ශාරීරික රූපයන්ගේ සැහැල්ලු බව යි. රූපවල තද නැති, මෘදු බව 'මුදුතා' නම් වේ. ක්‍රියාවට යෝග්‍ය බව 'කම්මඤ්ඤතා' නම්. මෙම රූප තුන වනාහි අන්‍ය රූපයන්ගේ ගුණයෝ ය. යහපත් හේතු යෙදීම නිසා රූපයන්ගේ සැහැල්ලු බව (ලහුතා), මෘදු බව (මුදුතා), කර්මන්‍ය බව (කම්මඤ්ඤතා) ඇති වේ.

**10) ලක්ඛණ-රූප සතර (25, 26, 27, 28)**

'උපචය' - 'සන්තති' - 'ජරතා' - 'අනිච්චතා' යනු රූපවල ම ලක්ඛණ (ලක්ෂණ) රූප ය. සත්ත්වයෙකු තුළ ඇති විය යුතු රූප සම්පූර්ණ වීමට පෙර හෙවත් හටගැනීමෙහි දී ඇති වන රූපවල උත්පාදය 'උපචය' නමින් ද රූප හටගැනීම සම්පූර්ණ වූ පසු බිඳී යන රූප වෙනුවට නැවත නැවත හටගන්නා රූපවල උත්පාදය 'සන්තති' නමින් ද හැඳින් වේ. රූපවල දිරීම 'ජරතා' නමින් ද රූපවල බිඳීම 'අනිච්චතා' නමින් ද හැඳින්වේ.

මෙම අටවිසි-රූප අතරින් පරිච්ඡේද-රූපය, විකාර-රූප පස, ලක්ෂණ-රූප සතර යන මෙම රූප දශය කර්මාදි ප්‍රත්‍යයන්ගෙන් සෘජු ව ම හටගන්නා රූප නො වන බැවින්

ඒවාට 'අනිෂ්පන්න'-රූප ය යි කියනු ලැබේ.

මෙම අටවිසි රූප අතුරෙන් විඤ්ඤත්ති-රූප දෙකෙහි ආයුෂ එක් චිත්තක්ෂණයකි. උපචය සහ සන්තති රූපවල ආයුෂ එක් කුඩා චිත්තක්ෂණයකි. ජරතා-රූපයේ ආයුෂ කුඩා චිත්තක්ෂණ හතළිස්නවයකි. අනිච්චතා-රූපයේ ආයුෂ කුඩා චිත්තක්ෂණ එකකි. ඉතිරි රූප දෙවිස්සෙහි ආයුෂ චිත්තක්ෂණ දහතකි.

# 4. නිබ්බාන (නිර්වාණ) - පරමාර්ථය

දුක සහ දුක හටගැනීමේ හේතු මුළුමනින් ම අභාවයට පත් වීම දුක්ඛනිරෝධය හෙවත් නිර්වාණධාතුව යි. එම නිර්වාණධාතුව අරමුණු වන්නේ මාර්ග-ඵල සිත්වලට ය. නිර්වාණය සාක්ෂාත් කොට ජීවත්වන්නහු පිළිබඳ නිවන සෝපාදිසේසනිබ්බානධාතු නමින් ද නිර්වාණය සාක්ෂාත් කොට ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවි බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලාගේ පිරිනිවීම අනුපාදිසේසනිබ්බානධාතු නමින් ද හැඳින්වෙතත් නිවන ස්වභාව වශයෙන් එකක් ම ය. එහි සැබෑ තතු දන්නෝ මාර්ගඵල-ලාභීහු ම වෙති.

ඒ උතුම් නිර්වාණධාතුව සාක්ෂාත් කිරීමට නුවණැති සත්පුරුෂයෝ වැයම් කරත්වා!

සාධු! සාධු!! සාධු!!!


ආශ්‍රිත ග්‍රන්ථ

- අභිධර්ම මාර්ගය
- අභිධර්මයේ මූලික කරුණු

} අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහානාහිමිපාණෝ

ධර්මදානය පිණිස යි.

පටිගත කරන ලද ධර්මදේශනා සහ ශ්‍රී සද්ධර්ම සංසදය මඟින් ප්‍රකාශිත දහම්පොත් www.theravada.mahavihara.org , www.sadaham.net යන වෙබ් අඩවි ඔස්සේ ලබා ගත හැකි ය.

ප්‍රකාශනය

ශ්‍රී සද්ධර්ම සංසදය

'සදහම් සෙවණ'

134/A, ගලගෙදර වත්ත,

මාතම්මන, මිනුවන්ගොඩ.

විමසීම්: 071-4417813

විද්‍යුත් ලිපිනය: info@mahavihara.org

වෙබ් අඩවි: www.theravada.mahavihara.org

www.sadaham.net